# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2012

# ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

www.SamithAlwis.wordpress.com

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2012

## ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

www.SamithAlwis.wordpress.com

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**ආර්ථික විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2012

## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

www.SamithAlwis.wordpress.com

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2012 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 196954 ක් පාසල් අයදුම්කරුවෝ ද 10954 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ආර්ථික විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ආර්ථික විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2012 විභාගයේ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මඟින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් මුද්‍රණය කර දුන් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2013 දෙසැම්බර් 01 දින
බත්තරමුල්ල, පැලවත්ත
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ
පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ දී ය.

www.SamithAlwis.wordpress.com

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | එල්.ජී.එස්. සමරකෝන්<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩැනී අතපත්තු<br>රුහුණු විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | ඩබ්ලිව්. ලයනල් වීරසිංහ<br>විශාඛා විද්‍යාලය<br>කොළඹ 05.<br><br>ඩී.ජී. සුගත් ගොඩගේ<br>මාර / ශාන්ත තෝමස් බාලිකා විද්‍යාලය<br>මාතර<br><br>කේ.එන්.ආර්. පෙරේරා<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කැළණිය |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ. ඉරෝෂා බණ්ඩාර<br>දත්ත සටහන් ක්‍රියාකරු<br><br>එම්.ඩබ්. පියුමි මධුශානී<br>දත්ත සටහන් ක්‍රියාකරු |

www.SamithAlwis.wordpress.com

# ඇතුළත පිටු

පිටු අංකය


## I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

## II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යූහය 9
2.1.2. I ප්‍රශ්න පත්‍රය 10
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 19
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 20
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යූහය 23
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන 24
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 59

## III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 60

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 61


www.SamithAlwis.wordpress.com

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1. විෂය අභිමතාර්ථ

- ★ සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳව විචාරාත්මක අවබෝධයක් ලබා දීම.
- ★ ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබා දීම.
- ★ සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම.
- ★ වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙළඹවීම.
- ★ ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම.
- ★ විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳව පිළිගත් අර්ථ කථන අධ්‍යයනයට අවස්ථා ලබා දීම.
- ★ වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ විමසා බැලීමට යොමු කිරීම.
- ★ පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබා දීම.
- ★ ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබා දීම.
- ★ ආර්ථික විද්‍යා විෂය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබා දීම.
- ★ අන්තර්ජාතික වෙළෙඳාමේ හා මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වා දීම.
- ★ ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම.
- ★ සමාජයේ යහපැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබා දීම.
- ★ උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා යෝග්‍ය පදනමක් ලබා දීම.

www.SamithAlwis.wordpress.com

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 56390 | 1968 | 58358 |
| දෙමළ | 8311 | 530 | 8841 |
| ඉංග්‍රීසි | 1609 | 445 | 2054 |
| එකතුව | 66310 | 2943 | 69253 |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 11246 | 16.96 | 205 | 6.96 | 11451 | 16.53 |
| B | 8881 | 13.39 | 183 | 6.22 | 9064 | 13.09 |
| C | 15366 | 23.17 | 477 | 16.21 | 15843 | 22.88 |
| S | 16572 | 25.00 | 741 | 25.18 | 17313 | 25.00 |
| F | 14245 | 21.48 | 1337 | 45.43 | 15582 | 22.50 |
| එකතුව | **66310** | **100.00** | **2943** | **100.00** | **69253** | **100.00** |

www.SamithAlwis.wordpress.com

වගුව 2

1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 9342 | 2047 | 21.91 | 1252 | 13.40 | 2047 | 21.91 | 2145 | 22.96 | 7491 | 80.19 | 1851 | 19.81 |
| 2. ගම්පහ | 5663 | 1033 | 18.24 | 696 | 12.29 | 1158 | 20.45 | 1383 | 24.42 | 4270 | 75.40 | 1393 | 24.60 |
| 3. කළුතර | 2820 | 510 | 18.09 | 373 | 13.23 | 646 | 22.91 | 706 | 25.04 | 2235 | 79.26 | 585 | 20.74 |
| 4. මහනුවර | 3492 | 468 | 13.40 | 396 | 11.34 | 785 | 22.48 | 899 | 25.74 | 2548 | 72.97 | 944 | 27.03 |
| 5. මාතලේ | 953 | 71 | 7.45 | 93 | 9.76 | 183 | 19.20 | 311 | 32.63 | 658 | 69.05 | 295 | 30.95 |
| 6. නුවරඑළිය | 1236 | 136 | 11.00 | 139 | 11.25 | 296 | 23.95 | 325 | 26.29 | 896 | 72.49 | 340 | 27.51 |
| 7. ගාල්ල | 2593 | 527 | 20.32 | 326 | 12.57 | 530 | 20.44 | 605 | 23.33 | 1988 | 76.67 | 605 | 23.33 |
| 8. මාතර | 1952 | 277 | 14.19 | 205 | 10.50 | 421 | 21.57 | 521 | 26.69 | 1424 | 72.95 | 528 | 27.05 |
| 9. හම්බන්තොට | 1342 | 198 | 14.75 | 183 | 13.64 | 287 | 21.39 | 322 | 23.99 | 990 | 73.77 | 352 | 26.23 |
| 10. යාපනය | 1047 | 132 | 12.61 | 139 | 13.28 | 276 | 26.36 | 264 | 25.21 | 811 | 77.46 | 236 | 22.54 |
| 11. කිලිනොච්චි | 117 | 21 | 17.95 | 18 | 15.38 | 33 | 28.21 | 26 | 22.22 | 98 | 83.76 | 19 | 16.24 |
| 12. මන්නාරම | 175 | 13 | 7.43 | 27 | 15.43 | 46 | 26.29 | 44 | 25.14 | 130 | 74.29 | 45 | 25.71 |
| 13. වව්නියාව | 267 | 51 | 19.10 | 50 | 18.73 | 80 | 29.96 | 55 | 20.60 | 236 | 88.39 | 31 | 11.61 |
| 14. මුලතිව් | 86 | 14 | 16.28 | 12 | 13.95 | 22 | 25.58 | 19 | 22.09 | 67 | 77.91 | 19 | 22.09 |
| 15. මඩකලපුව | 638 | 94 | 14.73 | 97 | 15.20 | 182 | 28.53 | 166 | 26.02 | 539 | 84.48 | 99 | 15.52 |
| 16. අම්පාර | 1058 | 140 | 13.23 | 147 | 13.89 | 245 | 23.16 | 319 | 30.15 | 851 | 80.43 | 207 | 19.57 |
| 17. ත්‍රිකුණාමලය | 601 | 59 | 9.82 | 76 | 12.65 | 165 | 27.45 | 156 | 25.96 | 456 | 75.87 | 145 | 24.13 |
| 18. කුරුණෑගල | 3476 | 524 | 15.07 | 417 | 12.00 | 723 | 20.80 | 883 | 25.40 | 2547 | 73.27 | 929 | 26.73 |
| 19. පුත්තලම | 1377 | 222 | 16.12 | 176 | 12.78 | 326 | 23.67 | 364 | 26.43 | 1088 | 79.01 | 289 | 20.99 |
| 20. අනුරාධපුරය | 1749 | 229 | 13.09 | 207 | 11.84 | 407 | 23.27 | 493 | 28.19 | 1336 | 76.39 | 413 | 23.61 |
| 21. පොළොන්නරුව | 847 | 90 | 10.63 | 92 | 10.86 | 173 | 20.43 | 238 | 28.10 | 593 | 70.01 | 254 | 29.99 |
| 22. බදුල්ල | 1713 | 253 | 14.77 | 186 | 10.86 | 387 | 22.59 | 468 | 27.32 | 1294 | 75.54 | 419 | 24.46 |
| 23. මොණරාගල | 712 | 108 | 15.17 | 108 | 15.17 | 176 | 24.72 | 161 | 22.61 | 553 | 77.67 | 159 | 22.33 |
| 24. රත්නපුරය | 2110 | 365 | 17.30 | 320 | 15.17 | 450 | 21.33 | 519 | 24.60 | 1654 | 78.39 | 456 | 21.61 |
| 25. කෑගල්ල | 1528 | 181 | 11.85 | 183 | 11.98 | 381 | 24.93 | 384 | 25.13 | 1129 | 73.89 | 399 | 26.11 |
| **සමස්ත දිවයින** | **46894** | **7763** | **16.55** | **5918** | **12.62** | **10425** | **22.23** | **11776** | **25.11** | **35882** | **76.52** | **11012** | **23.48** |

වගුව 3

www.SamathAlwis.wordpress.com

1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 860 | 1.24 | 69253 | 100.00 |
| 81 - 90 | 4829 | 6.97 | 68393 | 98.76 |
| 71 - 80 | 8163 | 11.79 | 63564 | 91.79 |
| 61 - 70 | 9921 | 14.33 | 55401 | 80.00 |
| 51 - 60 | 11257 | 16.25 | 45480 | 65.67 |
| 41 - 50 | 11843 | 17.10 | 34223 | 49.42 |
| 31 - 40 | 10616 | 15.33 | 22380 | 32.32 |
| 21 - 30 | 8135 | 11.75 | 11764 | 16.99 |
| 11 - 20 | 3431 | 4.95 | 3629 | 5.24 |
| 01 - 10 | 194 | 0.28 | 198 | 0.29 |
| 00 - 00 | 4 | 0.01 | 4 | 0.01 |

වගුව 5


www.SamithAlwis.wordpress.com

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙම විෂය සඳහා ලකුණු 31 - 40 අතර ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 10616 වන අතර, එය මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 15.33% කි. ලකුණු 40 දක්වා ලබා සිටි මුළු අපේක්ෂකයින් සංඛ්‍යාව 22380කි. එම ප්‍රමාණය මුළු අපේක්ෂකයින්ගෙන් 32.32% කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 1 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 94%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 47 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 24%කි.

www.SamithAlwis.wordpress.com

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : 'අ' කොටසේ 01 වන ප්‍රශ්නය, අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් තෝරා ගෙන ඇත. එහි ප්‍රතිශතය 95% කි. 'අ' කොටසේ 05 වන ප්‍රශ්නය, අඩුම පිරිසක් තෝරා ගෙන ඇති අතර, එහි ප්‍රතිශතය 18% කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි 04 වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. එම ලකුණු වලින් 76%-100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16-20ත් අතර ලබා ගත් ප්‍රතිශතය 14% කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0%-25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0-5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 30% පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

www.SamithAlwis.wordpress.com


### 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් දක්වා ඇත.

උදා:- 01 වන ප්‍රශ්නයෙහි (iii) කොටසෙහි පහසුතාව 46% ක් වන අතර, 04 වන ප්‍රශ්නයෙහි iv (ආ) කොටසෙහි පහසුතාව 73% කි.



www.SamithAlwis.wordpress.com

ප්‍රස්තාරය 4.2 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් දක්වා ඇත.

උදා:- 06 වන ප්‍රශ්නයෙහි iii (ආ) කොටසෙහි පහසුතාව 61% කි.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ⋆ කාලය පැය 02කි.
- ⋆ වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
- ⋆ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

www.SamithAlwis.wordpress.com

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. සම්පත්වල හිඟකමක් පවත්නා බැවින්,
   (1) සෑම සමාජයක් ම මධ්‍යගත සැලසුම්කරණය ක්‍රියාවට නැංවිය යුතුය.
   (2) පවත්නා සම්පත් විවිධ භාවිතයන් අතර බෙද වෙන් කළ යුතු ආකාරය ආණ්ඩුව විසින් තීරණය කළ යුතුය.
   (3) සෑම සමාජයක ම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් වශයෙන් ජීවත් විය යුතුය.
   (4) සෑම සමාජයක් ම පවත්නා සම්පත්වල විකල්ප භාවිත අතර තේරීමක් කළ යුතුය.
   (5) සමාජයේ පවත්නා සම්පත් ප්‍රමාණය, ඒවා යොද ගත හැකි භාවිතයන්ගේ ප්‍රමාණයට වඩා වැඩි වනු ඇත.

2. පහත සඳහන් ද අතුරෙන් නිෂ්පාදන හැකියා වක්‍රයක් පිටතට විතැන්වීම කෙරෙහි **බලනොපාන** කරුණ වනුයේ,
   (1) තාක්ෂණය දියුණු වීමය.
   (2) වඩාත් විවෘත ප්‍රවේශයකින් අබාධ වෙළෙඳම කරා නැඹුරු වීමය.
   (3) විරැකියාව පහළ වැටීමය.
   (4) ජනගහනයේ අධ්‍යාපන මට්ටම් ඉහළ යාමය.
   (5) ඵලදයිතාව ඉහළ යාමය.


3. සියලු ම නිෂ්පාදන කටයුතු සඳහා යොද ගනු ලබන සම්පත් එකිනෙකට පූර්ණ ආදේශක වූව හොත්, පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?
   (1) සියලු ම භාණ්ඩවල නිමැවුම ආවස්ථික පිරිවැයකින් තොර ව ඉහළ නැංවිය හැකිය.
   (2) නිෂ්පාදන හැකියා වක්‍රය සරල රේඛාවක් වනු ඇත.
   (3) විශේෂීකරණය සහ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට වාසි ගෙන දෙන වෙළෙඳමක් හට ගැනීමට කිසිදු ඉඩක් නොමැත.
   (4) කවර හෝ නිෂ්පාදන කටයුත්තක් සම්බන්ධයෙන් කිසිදු රටකට හෝ කිසිදු පුද්ගලයකුට හෝ සාපේක්ෂ වාසියක් ඇති නොවේ.
   (5) සම්පත් පිළිබඳ හිඟකම මුලුමනින් ම පහව යනු ඇත.

4. පහත සඳහන් ඒවා අතුරෙන් සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක මාතෘකාවක් වනුයේ කවරක් ද?
   (1) පොලී අනුපාතිකයන් පොදුවේ ඉහළ යාම
   (2) උද්ධමන අනුපාතිකය පහළ වැටීම
   (3) ඇමෙරිකා එක්සත් ජනපදයේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම
   (4) ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතිකය පහළ වැටීම
   (5) කිරිපිටි මිල ඉහළ යාම

5. පහත සඳහන් ද අතුරෙන් නොමිල භාණ්ඩයක (a free good) ලක්ෂණයක් වන්නේ කවරක් ද?
   (1) එබඳු භාණ්ඩයක් සැපයීමේ දී ආවස්ථික පිරිවැයක් ඇති නොවීම
   (2) එබඳු භාණ්ඩයක පරිභෝජනය සමාජයීය වශයෙන් හිතකර වේ යැයි සලකනු ලබන බැවින්, ඒවා සාමාන්‍යයෙන් රජය විසින් සැපයීම
   (3) එබඳු භාණ්ඩයක පරිභෝජනය හෝ නිෂ්පාදනය හෝ බාහිරතා බිහි නො කිරීම
   (4) එබඳු භාණ්ඩයක සැපයුම පූර්ණ වශයෙන් අනම්‍ය වීම
   (5) එබඳු භාණ්ඩයක නිෂ්පාදනය හීනවන ඵලද නීතියට යටත් වීම

6. නිදහස් වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක මූලික අංගයක් වනුයේ,
   (1) ආණ්ඩුවේ මැදිහත්වීම ඉතා ඉහළ මට්ටමක තිබීමය.
   (2) සම්පත් පිළිබඳ පොදු හිමිකාරිත්වයයි.
   (3) පෞද්ගලික දේපොල ක්‍රමයයි.
   (4) මධ්‍යගත සැලසුම් අධිකාරීන් විසින් වැටුප් සහ මිල තීරණය කිරීමය.
   (5) අවශ්‍ය කරන කුසලතා සහිත සේවකයන් බඳවා ගැනීමේ දී සේව්‍ය පක්ෂය විසින් රාජ්‍ය ආයතනවලින් උපදෙස් ලබා ගැනීමය.

7.




X නමැති භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම ඉහත රූපසටහන පෙන්නුම් කරයි. එහි A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා ගමන් කිරීමට බලපෑ ප්‍රධාන සාධකය වනුයේ,
   (1) Y නමැති ආදේශක භාණ්ඩයෙහි මිල ඉහළ යාමය.
   (2) පාරිභෝගිකයන්ගේ ආදායමෙහි ඉහළ යාමය.
   (3) පාරිභෝගිකයන්ගේ ආදායමෙහි පහළ යාමය.
   (4) X භාණ්ඩයෙහි නිෂ්පාදන පිරිවැය අඩු වීමය.
   (5) X භාණ්ඩයෙහි සැපයුම අඩු වීමය.

www.SamithAlwis.wordpress.com

8. කිසියම් භාණ්ඩයක සැපයුම් වක්‍රය වමට විතැන් කිරීමෙහි ලා බලපානුයේ, පහත සඳහන් කවර කරුණක් ද?
   (1) නිෂ්පාදන පිරිවැය ඉහළ යාම
   (2) නිෂ්පාදන පිරිවැය පහළ යාම
   (3) භාණ්ඩයෙහි මිල ඉහළ යාම
   (4) භාණ්ඩයෙහි මිල පහළ යාම
   (5) ඉල්ලුම අඩු වීම


9. අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී සහල් මිල අඩු වූ විට, සහල් සඳහා තමන් විසින් වැය කරනු ලැබූ මුලු වියදම නොවෙනස් ව පැවැති බව, කිසියම් පාරිභෝගිකයෙක් නිරීක්ෂණය කරයි. මෙම මිල වෙනස්වීම, සම්බන්ධයෙන් එළැඹිය හැකි නිවැරදි නිගමනය වනුයේ කවරක් ද?
   (1) මෙම පාරිභෝගිකයා සහල්, බාල භාණ්ඩයක් ලෙස සලකයි.
   (2) මිල වෙනස්වීමට සංවේදී ව සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම වැඩි වූයේය.
   (3) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවක් පෙන්නුම් කරයි.
   (4) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම පූර්ණ මිල අනම්‍යතාවක් පෙන්නුම් කරයි.
   (5) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම ඒකීය මිල නම්‍යතාවක් පෙන්නුම් කරයි.

10. සඵල අවම මිල ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම නිසා
   (1) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය ඉහළ නගී.
   (2) පාරිභෝගික අතිරික්තය ඉහළ නගින අතර, නිෂ්පාදක අතිරික්තය පහළ බසී.
   (3) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය පහළ බසී.
   (4) පාරිභෝගික අතිරික්තය පහළ බසින අතර, නිෂ්පාදක අතිරික්තය ඉහළ නගී.
   (5) පාරිභෝගික අතිරික්තයට හා නිෂ්පාදක අතිරික්තයට කිසිදු බලපෑමක් සිදු නොවේ.

11. X භාණ්ඩය සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ද, X සහ Y යන භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයයක් ද වේ නම්, X භාණ්ඩය පිළිබඳ ව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
   (1) X සාමාන්‍ය භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සඳහා ආදේශකයක් ද වේ.
   (2) X සාමාන්‍ය භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සමග අනුපූරක සම්බන්ධයක් පෙන්නුම් කරයි.
   (3) X බාල භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සඳහා ආදේශකයක් ද වේ.
   (4) X බාල භාණ්ඩයක් වන අතර, එය Y භාණ්ඩය සමග අනුපූරක සම්බන්ධයක් පෙන්නුම් කරයි.
   (5) X සාමාන්‍ය භාණ්ඩයක් වන අතර, Y භාණ්ඩය බාල භාණ්ඩයක් වේ.

12. බෝතල් කරන ලද පානීය ජලය සඳහා ඇති ඉල්ලුම, සාපේක්ෂ වශයෙන් මිල නම්‍ය වේතියි සලකන්න. මෙම තත්ත්වය යටතේ බෝතල් කරන ලද පානීය ජල සැපයුමෙහි වැඩි වීමක් සිදු වුව හොත්, පහත සඳහන් කවර ප්‍රතිවිපාකයක් හට ගනු ලැබේ ද?
   (1) මුළු අයභාරය ඉහළ නංවමින් මිල පහළ බසී.
   (2) මුළු අයභාරය පහළ හෙළමින් මිල පහළ බසී.
   (3) බෝතල් කරන ලද පානීය ජලයෙහි අධි සැපයුමක් හට ගනී.
   (4) බෝතල් කරන ලද පානීය ජලය සඳහා අධි ඉල්ලුමක් හට ගනී.
   (5) මිලෙහි සාපේක්ෂ වශයෙන් සුළු අඩු වීමක් හට ගන්නා නමුදු, සමතුලිත ප්‍රමාණයෙහි වෙනසක් හට නොගනී.

13.





X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ, ඉහත රූපසටහන නිරූපණය කරයි. X භාණ්ඩය මත විශේෂිත බද්දක් පනවනු ලැබුව හොත්, බද්දට පසු පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදක අතිරික්තය සහ අහිමිවුණු ශුභ සාධනය (deadweight loss) පෙන්නුම් කරනුයේ පහත දක්වෙන කවර කොටස්වලින් ද?

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය | අහිමිවුණු ශුභ සාධනය |
|---|---|---|---|
| (1) | A | G + F + E + H | D + E |
| (2) | A | H | D + E |
| (3) | A + B | G + F + E | C + D |
| (4) | A + B + C + D | G + F + E + H | D + E |
| (5) | A + B + C + D | H + F + C | E |

www.SamithAlwis.wordpress.com

14. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළක් පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.




ආණ්ඩුව මෙම භාණ්ඩය සඳහා $0P_2$ ක් වූ අවම මිලක් හඳුන්වා දෙනු ලබන අතර, අවම මිල නිසා වෙළෙඳපොළේ ඇතිවිය හැකි අතිරික්ත තොග, මුළුමනින් ම ආණ්ඩුව විසින් මිල දී ගනු ලැබේ යයි ද සලකන්න. මෙහි දී ගොවීන්ගේ මුළු අයභාරය වනුයේ,

(1) $0P_2KQ_3$ කි. (2) $0P_1ZQ_2$ කි. (3) $0P_2XQ_1$ කි. (4) $Q_1XYQ_2$ කි. (5) $P_1P_2ZY$ කි.

15. එක්තරා නිෂ්පාදන ආයතනයක්, X නමැති භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා, ස්ථාවර ප්‍රාග්ධන යෙදවුම් ප්‍රමාණයක් සමඟ විචල්‍ය ශ්‍රම යෙදවුම් ප්‍රමාණයක් සේවා නියුක්ත කරයි. මෙහි දී ශ්‍රමයට ගෙවනු ලබන දෛනික වැටුප ඉහළ නැගුණ හොත්, එම වැටුප් ඉහළ යාම ආයතනයේ නිෂ්පාදන පිරිවැය මත කෙලෙස බලපානු ලැබේ ද?

| | මුළු විචල්‍ය පිරිවැය | මුළු ස්ථාවර පිරිවැය | මුළු පිරිවැය |
|---|---|---|---|
| (1) | අඩු වේ | වෙනස් නොවේ | අඩු වේ |
| (2) | අඩු වේ | අඩු වේ | අඩු වේ |
| (3) | වැඩි වේ | අඩු වේ | වෙනස් නොවේ |
| (4) | වැඩි වේ | වෙනස් නොවේ | වැඩි වේ |
| (5) | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |

16. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක් තුළ කටයුතු කරන නිෂ්පාදන ආයතනයක, ආන්තික අයභාරය නිවැරදි ව දක්වෙනුයේ පහත සඳහන් කවර ප්‍රකාශනයකින් ද?
(1) එය ස්ථාවර අගයක් ගනී.
(2) අලෙවි කළ නිමැවුම් ප්‍රමාණය වැඩිවෙත් ම එය ඉහළ නගී.
(3) අලෙවි කළ නිමැවුම් ප්‍රමාණය වැඩිවෙත් ම එය පහළ බසී.
(4) එය මුල දී ඉහළ ගොස් පසුව පහළ බසී.
(5) එය මුල දී පහළ බැස පසුව ඉහළ නගී.

17. ඒකාධිකාරී තරගය නමැති වෙළෙඳපොළ ව්‍යුහයෙහි
(1) දක්නට ලැබෙනුයේ එක් නිෂ්පාදන ආයතනයක් පමණි.
(2) දක්නට ලැබෙනුයේ ආයතන සුළු ප්‍රමාණයකි.
(3) සමජාතීය වූ භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතන විශාල සංඛ්‍යාවක් ඇත.
(4) ප්‍රභේදනය වූ භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතන විශාල සංඛ්‍යාවක් ඇත.
(5) ප්‍රචාරණය සිදු නොවේ.

18. දළ දේශීය නිෂ්පාදිතය,
(1) දෙන ලද වර්ෂය තුළ ගනුදෙනු කරනු ලැබූ මුළු භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ වටිනාකමට සමාන වේ.
(2) දෙන ලද වර්ෂය තුළ මිල දී ගනු ලැබූ ව්‍යාපාරික කොටස් හෝ අලෙවි කරන ලද බැඳුම්කර හෝ වැනි මූල්‍ය ගනුදෙනුවලින් සමන්විත වේ.
(3) ගණනය කිරීමේ දී, අතරමැදි නිෂ්පාදන අදියරයන්හි දී මිල දී ගනු ලැබූ භාණ්ඩ ද ඇතුළත් කෙරේ.
(4) දෙන ලද වර්ෂය තුළ දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබූ, සියලු ම අවසාන භාණ්ඩ හා සේවා සඳහා වැය කරන ලද මුළු වියදම්වල එකතුවට සමාන වේ.
(5) දෙන ලද වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද සියලු ම භාණ්ඩ හා සේවාවලින් සමන්විත වේ.

19. ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණාත්මක අදියරේ දී සිදු වීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇත්තේ,
(1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම සහ සේවා වියුක්තිය අඩු වීමය.
(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම සහ විරැකියාව ඉහළ යාමය.
(3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටීම සහ උද්ධමනය ඉහළ යාමය.
(4) පොලී අනුපාතික ඉහළ යාම සහ බිඳ වැටෙන ව්‍යාපාර සංඛ්‍යාව ඉහළ යාමය.
(5) උද්ධමනය ඉහළ යාම සහ සේවා නියුක්තිය පහළ යාමය.

www.SamithAlwis.wordpress.com

20. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී පහත සඳහන් ද අතුරෙන් එක් අයිතමයක් හැර අන් සියල්ල ම බැහැර කෙරේ. එලෙස බැහැර **නොකෙරෙන** අයිතමය වනුයේ,
(1) අතරමැදි භාණ්ඩවල වටිනාකමය.
(2) සලකා බලන වර්ෂය තුළ ඉදිකරන ලද සියලු ම නිවාසවල වටිනාකමය.
(3) පාවිච්චි කරන ලද භාණ්ඩවල වටිනාකමය.
(4) ශුද්ධ වශයෙන් මූල්‍යමය ස්වරූපයක් ගන්නා ගනුදෙනුය.
(5) ආණ්ඩුවෙන් ලබා දෙන සහනාධාරය.

21. එක්තරා ආර්ථිකයක් සඳහා අදාළ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දක් වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් බිලියනවලිනි.)

| | |
|---|---|
| ආණ්ඩුවේ මිල දී ගැනීම් | 500 |
| වැටුප් හා ශ්‍රමිකයින්ගේ වෙනත් අතිරේක ආදායම් | 2 000 |
| ක්ෂයවීම් | 400 |
| දළ ආයෝජනය | 400 |
| පෞද්ගලික පරිභෝජනය | 2 200 |
| ශුද්ධ අපනයන | –50 |
| ශුද්ධ වක්‍ර බදු | 150 |

වෙළඳපොළ මිල යටතේ ශුද්ධ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම
(1) රුපියල් බිලියන 2 650 කි.
(2) රුපියල් බිලියන 3 050 කි.
(3) රුපියල් බිලියන 3 150 කි.
(4) රුපියල් බිලියන 3 400 කි.
(5) රුපියල් බිලියන 4 650 කි.

22. සමතුලිතතාවේ පවතින ආර්ථිකයක අපනයන රු. මිලියන 400 ක් ද, ආනයන රු. මිලියන 500 ක් ද, බදු රු. මිලියන 1 200 ක්ද ආණ්ඩුවේ මිල දී ගැනීම් රු. මිලියන 1 500 ක් ද, ඉතුරුම් රු. මිලියන 1 000 ක් ද වේ යැයි සලකන්න. එම ආර්ථිකයෙ ආයෝජන මට්ටම
(1) රු. මිලියන 700 කි.
(2) රු. මිලියන 800 කි.
(3) රු. මිලියන 1 000 කි
(4) රු. මිලියන 1 200 කි.
(5) රු. මිලියන 1 300 කි.


23. සමාහාර ඉල්ලුමෙහි විශාලතම වැඩි වීම හට ගනුයේ පහත සඳහන් කවරක් හේතු කොට ගෙන ද?
(1) රුපියල් මිලියන 100 කින් බදු ඉහළ දැමීම
(2) රුපියල් මිලියන 100 කින් බදු පහළ දැමීම
(3) රුපියල් මිලියන 100 කින් ආණ්ඩුවේ මිල දී ගැනීම් ඉහළ යෑම
(4) රුපියල් මිලියන 100 කින් බදු ඉහළ දැමීමත් සමඟ ම ආණ්ඩුවේ මිල දී ගැනීම් රු. මිලියන 100කින් වැඩි කිරීම
(5) රුපියල් මිලියන 100 කින් බදු පහළ හෙළීමත් සමඟ ම ආණ්ඩුවේ මිල දී ගැනීම් රුපියල් මිලියන 100කින් වැඩි කිරීම

24. එක්තරා ආර්ථිකයක, ස්වායත්ත වියදම් රුපියල් මිලියන 100 කින් ඉහළ යන විට, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 500 කින් ඉහළ ගියේ නම්, එම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැඹියාව විය යුත්තේ,
(1) 0.2 කි. (2) 0.4 කි. (3) 0.5 කි. (4) 0.8 කි. (5) 5.0 කි.

25. කිසියම් ආර්ථිකයක නාමික දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 5 000 ක්ද, මුදල් සැපයුම රුපියල් බිලියන 1 000 ක් ද වූයේ නම්, එම ආර්ථිකයෙහි සංසරණ ප්‍රවේගය
(1) 0.2 කි. (2) 0.5 කි. (3) 5 කි. (4) 4 000 කි. (5) 6 000 කි.

www.SamithAlwis.wordpress.com

26. එක්තරා ආර්ථිකයක විවිධ සමාහාර ඉල්ලුම් මට්ටම්වලට අනුරූප විවිධ සමතුලිත ආදායම් මට්ටම්, පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.




මෙම ආර්ථිකයෙහි පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම $Y_F$ වේ නම්, උද්ධමනාත්මක පරතරය නිරූපණය වන්නේ කවර දුර ප්‍රමාණයකින් ද?
(1) SH (2) RH (3) LG (4) $Y_FR$ (5) $Y_2G$

27. සංචිත අවශ්‍යතාව 20% ක් සහිත එක්තරා බැංකු පද්ධතියක් තුළ, රුපියල් මිලියන 100 ක අධි සංචිත පවතී නම්, එම බැංකු පද්ධතියට මුදල් සැපයුම උපරිම වශයෙන් ප්‍රසාරණය කිරීමට හැකිවනුයේ,
(1) රුපියල් මිලියන 20 කිනි.
(2) රුපියල් මිලියන 100 කිනි.
(3) රුපියල් මිලියන 300 කිනි.
(4) රුපියල් මිලියන 500 කිනි.
(5) රුපියල් මිලියන 750 කිනි.

28. ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීම සඳහා මහජනතාවගේ ඇති කැමැත්ත වැඩි වුව හොත්, එය බැංකු පද්ධතිය කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති කරනුයේ ද?
(1) ද්‍රවශීල වත්කම් ඉහළ නංවා ගැනීම සඳහා බැංකුවලට වැඩි හැකියාවක් ලැබෙනු ඇත.
(2) ඉපැයීමේ වත්කම් ඉහළ නංවා ගැනීම සඳහා බැංකුවලට ඇති හැකියාව වැඩි වනු ඇත.
(3) බැංකු විසින් අයකරනු ලබන පොලී අනුපාතික පහළ දැමීමට බැංකුවලට ඇති හැකියාව අඩු වනු ඇත.
(4) ණය සැපයුම ප්‍රසාරණය කිරීමට බැංකුවලට වැඩි හැකියාවක් ලැබෙනු ඇත.
(5) ණය සැපයුම ප්‍රසාරණය කිරීමට බැංකුවලට ඇති හැකියාව අඩු වනු ඇත.

29. වාණිජ බැංකු පද්ධතිය සතු සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 100 ක් ද, තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 800 ක් ද, මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 200 ක් ද වේයැයි සලකන්න. මෙම තත්ත්වය යටතේ මුදල් ගුණකය වනුයේ,
(1) 0.30 කි. (2) 0.37 කි. (3) 2.70 කි. (4) 2.95 කි. (5) 3.33 කි.

30. මහ බැංකුව විසින් විවෘත වෙළෙඳපොළෙහි ආණ්ඩුවේ සුරැකුම්පත් මිල දී ගනු ලැබුව හොත්
(1) බැංකුවල සංචිත වැඩි වන අතර, පදනම් මුදල් ප්‍රමාණය ද වැඩි වේ.
(2) බැංකුවල සංචිත අඩු වන අතර, පදනම් මුදල් ප්‍රමාණය ද අඩු වේ.
(3) බැංකුවල සංචිත වැඩි වන අතර, පදනම් මුදල් ප්‍රමාණය අඩු වේ.
(4) බැංකුවල සංචිත අඩු වන අතර, පදනම් මුදල් ප්‍රමාණය වැඩි වේ.
(5) බැංකුවල සංචිත අඩු වන අතර, බැංකු සතු ව අධි සංචිත පවතී නම් මුදල් සැපයුම වැඩිවනු ඇත.

31. වෙළෙඳපොළ අසාර්ථකත්වයක් නිවැරදි කිරීම සඳහා ආණ්ඩුවේ මැදිහත්වීමට හේතුවක් වනුයේ පහත සඳහන් කවර කරුණක් ද?
(1) බාල භාණ්ඩ (inferior goods) තිබීම
(2) පරිමාණානුකූල නොපිරිමැසුම් හට ගැනීම
(3) නිෂ්පාදනයේ සහ පරිභෝජනයේ බාහිරතා හට ගැනීම
(4) සමජාතීය භාණ්ඩ තිබීම
(5) ප්‍රචාරණය සිදුවීම

www.SanthAlwis.wordpress.com

32. ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීම නිසා හට ගන්නා පෞද්ගලික හා බාහිර පිරිවැයත්, පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත් පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.


| (සංඛ්‍යා රුපියල් බිලියනවලින්) | |
|---|---|
| පෞද්ගලික ප්‍රතිලාභ | 180 |
| පෞද්ගලික පිරිවැය | 190 |
| බාහිර ප්‍රතිලාභ | 110 |
| බාහිර පිරිවැය | 140 |

මෙම දත්තවලට අනුව, සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ අතර වෙනස වනුයේ,
(1) රුපියල් බිලියන 120කි.
(2) රුපියල් බිලියන 50කි.
(3) රුපියල් බිලියන 40කි.
(4) රුපියල් බිලියන 30කි.
(5) රුපියල් බිලියන 10කි.

33. නිදහස් වෙළඳපොළ ආර්ථිකයක්, හිඟ සම්පත් ප්‍රශස්ත ලෙස බෙද වෙන් කිරීමේ ලා අසාර්ථක වීමට බලපාන එක් හේතුවක් වනුයේ,
(1) පොදු භාණ්ඩ මිලක් අය නො කොට ඒවා භාවිත කරන අයට ලබා දීමය.
(2) ධන බාහිරතා නිසා ඇතැම් භාණ්ඩවල අධි නිෂ්පාදනයක් සිදුවීමය.
(3) ධන බාහිරතා ඇති භාණ්ඩවල ඌන නිෂ්පාදනයක් සිදුවීමය.
(4) සෑම පුද්ගලයකුගේ ම ආදායම හා ධනය එක සමාන නො වීමය.
(5) තරගය පැවැතීමය.

34. ගුහ සාධන භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් රූපසටහනෙහි දක් වේ.

මෙම භාණ්ඩයේ පරිභෝජනය $0Q_1$ සිට $0Q_2$ දක්වා ඉහළ නැංවීම සඳහා ආණ්ඩුවට
(1) ඒකකයකට $P_3P_2$ ප්‍රමාණයක් වන ලෙස, බද්දක් නිෂ්පාදකයන්ගෙන් අය කළ හැකිය.
(2) ඒකකයකට $P_3P_1$ ප්‍රමාණයක් වන ලෙස සහනාධාරයක් නිෂ්පාදකයන්ට ලබා දිය හැකිය.
(3) $0P_3$ ක් වන සේ උපරිම මිලක් නියම කළ හැකිය.
(4) $0P_2$ ක් වන සේ අවම මිලක් නියම කළ හැකිය.
(5) $0P_1$ ක් වන සේ සහතික මිලක් ලබා දිය හැකිය.




35. උග්‍ර පසුබෑමකට (severe recession) මුහුණ පා සිටින ආර්ථිකයක, නිෂ්පාදනය උත්තේජනය කිරීමේ ලා වඩාත් සඵල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වනුයේ,
(1) ආණ්ඩුවේ වියදම් වැඩි කිරීමය.
(2) ආණ්ඩුවේ වියදම් අඩු කිරීමය.
(3) පෞද්ගලික ආදායම් බදු ඉහළ නැංවීමය.
(4) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳපොළෙහි සුරැකුම්පත් අලෙවිකිරීමය.
(5) මහ බැංකුව විසින් විවෘත වෙළඳපොළෙහි සුරැකුම්පත් මිල දී ගැනීමය.

36. X හා Y යන රටවල ආහාර ඒකකයක් හා රෙදි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ශ්‍රම පැය සංඛ්‍යාවන් පහත වගුවේ දක් වේ.

| රට | ආහාර | රෙදි |
|---|---|---|
| X | පැය 20 | පැය 50 |
| Y | පැය 10 | පැය 20 |

මෙම තොරතුරුවලට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක් ද?
(1) ආහාර සහ රෙදි යන භාණ්ඩ දෙක ම නිපදවීමෙහි ලා සාපේක්ෂ වාසි X රටට තිබේ.
(2) ආහාර සහ රෙදි යන භාණ්ඩ දෙක ම නිපදවීමෙහි ලා සාපේක්ෂ වාසි Y රටට තිබේ.
(3) ආහාර නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය X රටට ඇති අතර, රෙදි නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය Y රටට ඇත.
(4) ආහාර නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය Y රටට ඇති අතර, රෙදි නිෂ්පාදනයෙහි ලා සාපේක්ෂ වාසිය X රටට ඇත.
(5) කවර භාණ්ඩයක්වත් නිෂ්පාදනය කිරීමෙහි ලා සාපේක්ෂ වාසියක් කිසිදු රටක නො මැත.

37. කිසියම් රටක පහත දක්වෙන කල්පිත ගෙවුම් ශේෂ දත්ත සැලකිල්ලට ගන්න.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| භාණ්ඩ අපනයන | 11 000 |
| භාණ්ඩ ආනයන | 13 000 |
| ශුද්ධ සේවා | 200 |
| ශුද්ධ ආදායම් | −2 000 |
| ශුද්ධ වර්තන සංක්‍රාම | −100 |

www.SamithAlwis.wordpress.com

ගෙවුම් ශේෂයේ වර්තන ගිණුම පෙන්නුම් කරනුයේ,
(1) රුපියල් බිලියන 4 100ක හිඟයකි.
(2) රුපියල් බිලියන 3 900 ක හිඟයකි.
(3) රුපියල් බිලියන 120 ක හිඟයකි.
(4) රුපියල් බිලියන 2 188 ක අතිරික්තයකි.
(5) රුපියල් බිලියන 120 ක අතිරික්තයකි.


38. කිසියම් රටක ගෙවුම් ශේෂ ලේඛනයේ භාණ්ඩ ගිණුමෙහි ධන ශේෂයක් පවතීනම්, ඉන් ගම්‍ය වනුයේ,
(1) එම රටෙහි වෙළෙඳ අනුපාත දර්ශකය ඊට පෙර වර්ෂයට වඩා ඉහළ අගයක් ගෙන ඇති බවය.
(2) එම රට ආනයනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණයට වඩා වැඩි භාණ්ඩ ප්‍රමාණයක්, අපනයනය කරනු ලබන බවය.
(3) වර්තන ගිණුමෙහි ප්‍රගතියක් හට ගෙන ඇති බවය.
(4) ආනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකම, අපනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකමට වඩා අඩු වී ඇති බවය.
(5) ආනයන මිල ගණන්වලට වඩා අපනයන මිල ගණන් ඉහළ ගොස් ඇති බවය.

39. A නමැති රටට සෑම භාණ්ඩයක් ම නිෂ්පාදනය කිරීමෙහි ලා නිරපේක්ෂ වාසි පවතී නම්,
   (1) A රටට සෑම භාණ්ඩයක් ම පිළිබඳ ව සාපේක්ෂ වාසි ද පවතින බැවින්, වෙළෙඳාමක් සිදු වීමට ඉඩක් නොමැත.
   (2) කිසි ම රටකට කිසිදු භාණ්ඩයක් පිළිබඳ ව සාපේක්ෂ වාසි නොමැති හෙයින් වෙළෙඳාමක් සිදු වීමට ඉඩක් නොමැත.
   (3) බොහෝ සෙයින් වෙළෙඳාමක් සිදු වීමට ඉඩක් පවතින අතර, වෙළඳාමට සහභාගී වන සියලු ම රටවල් එමඟින් වාසි ලබා ගනු ඇත.
   (4) බොහෝ සෙයින් වෙළෙඳාමක් සිදු වීමට ඉඩක් පවතින අතර, එම නිසා A රටට වාසියක් ඇති නොවේ.
   (5) වෙළෙඳාමක් සිදු වීමට ඉඩක් පවතින අතර, වෙළෙඳාමෙන් වාසි ලැබෙනුයේ A රටට පමණි.

40. ඩොලරය හා රුපියල අතර නාමික විනිමය අනුපාතිකය $1 = රු. 110 ක සිට $1 = රු. 135 ක් දක්වා වෙනස් වූයේ නම්, එවිට
   (1) රුපියලේ අගය ඉහළ යන අතර, ඩොලරයේ අගය ක්ෂය වේ.
   (2) ඇමෙරිකානුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩවල මිල අඩු වන අතර, ශ්‍රී ලංකාවෙන් ඇමෙරිකාවට ආනයනය කෙරෙන ප්‍රමාණය වැඩිවනු ඇත.
   (3) ඇමෙරිකානුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩවල මිල අධික වන අතර, ශ්‍රී ලංකාවෙන් ඇමෙරිකාවට ආනයනය කෙරෙන ප්‍රමාණය වැඩිවනු ඇත.
   (4) ඇමෙරිකානුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩවල මිල අධික වන අතර, ශ්‍රී ලංකාවෙන් ඇමෙරිකාවට ආනයනය කෙරෙන ප්‍රමාණය පහළ වැටෙනු ඇත.
   (5) ඇමෙරිකානුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩවල මිල අඩුවන අතර, ශ්‍රී ලංකාවෙන් ඇමෙරිකාවට ආනයනය කෙරෙන භාණ්ඩ ප්‍රමාණය පහළ වැටෙනු ඇත.

41. ගෙවුම් ශේෂයේ හට ගන්නා තාවකාලික අසමතුලිතතාවන්ට මුහුණ දීම සඳහා නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ යොද ගැනෙන ප්‍රාථමික යන්ත්‍රණය වනුයේ,
   (1) දැඩි විනිමය පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමය.
   (2) අතිරික්ත ඇති රටවල සිට හිඟයන් ඇති රටවලට මුදල් ගලා යාමය.
   (3) විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම හෝ ප්‍රතිප්‍රමාණය කිරීමය.
   (4) විනිමය අනුපාතිකය ක්ෂයවීමට හෝ අගය ඉහළ යාමට ඉඩ දීමය.
   (5) දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමය.

42. A සහ B යන රටවල් සඳහා වන ලෝරන්ස් වක්‍ර පහත රූපසටහනෙහි දක් වේ.




මෙම රූපසටහනට අනුව, පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක් ද?
   (1) B රටට වඩා A රටෙහි, වඩාත් සාධාරණ වූ ආදායම් ව්‍යාප්තියක් පවතී.
   (2) A රටට වඩා B රටෙහි, වඩාත් සාධාරණ වූ ආදායම් ව්‍යාප්තියක් පවතී.
   (3) A රටෙහි ජිනි සංගුණකය 1ට සමාන වේ.
   (4) B රටෙහි ජිනි සංගුණකය 1ට සමාන වේ.
   (5) A රටෙහි ජිනි සංගුණකය B රටට වඩා ඉහළ අගයක් ගනී.

www.SamithAlwis.wordpress.com

43. නාමික විනිමය අනුපාතිකය යොද ගනිමින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් මනිනු ලබන ප්‍රති ශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය, ඉහළ ආදායම් රටවල් හා අඩු ආදායම් රටවල් අතර, ජීවන තත්ත්වයන්ගේ පවත්නා සාපේක්ෂ වෙනස්කම් පෙන්නුම් කිරීමේ ලා අසතුටුදායක මිනුමක් වනුයේ,
   (1) නාමික විනිමය අනුපාතිකයන් හා ක්‍රයශක්ති සාම්‍ය විනිමය අනුපාතිකයන් අතර පවත්නා වෙනස්කම් නිසාය.
   (2) ජනගහන වර්ධන අනුපාතිකයන් අතර පවතින වෙනස්කම් නිසාය.
   (3) මිල හා වැටුප් උද්ධමන අනුපාතිකයන් අතර පවත්නා වෙනස්කම් නිසාය.
   (4) ජාතික ආදායම හා ආනයන අතර පවතින අනුපාතයන්ගේ වෙනස්කම් නිසාය.
   (5) නාමික සඵල විනිමය අනුපාතිකයන් අතර පවත්නා වෙනස්කම් නිසාය.

44. රටක දිගු කාලීන ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය වනුයේ පහත සඳහන් සාධකයන්ගේ කවර සංයෝජනයක් හේතුකොට ගෙන ද?

| | ඉතුරුම් අනුපාතිකය | ආයෝජනය | පොලී අනුපාතික |
|---|---|---|---|
| (1) | ඉහළ යාම | ඉහළ යාම | ඉහළ යාම |
| (2) | ඉහළ යාම | ඉහළ යාම | පහළ යාම |
| (3) | ඉහළ යාම | පහළ යාම | පහළ යාම |
| (4) | පහළ යාම | පහළ යාම | පහළ යාම |
| (5) | ඉහළ යාම | පහළ යාම | ඉහළ යාම |

45. කිසියම් රටක ප්‍රජා විද්‍යාත්මක දත්ත කිහිපයක් පහත දක් වේ. (සියලු ම දත්ත මිලියනවලිනි.)

| | |
|---|---|
| ජනගහනය | 60 |
| වැඩකළ හැකි වයසේ ජනගහනය | 50 |
| ශ්‍රම හමුදාවේ ප්‍රමාණය | 30 |
| සේවා නියුක්ත සංඛ්‍යාව | 28 |
| සේවා වියුක්ත සංඛ්‍යාව | 2 |

මෙම දත්තවලට අනුව ආර්ථිකයේ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය

(1) 40% කි. (2) 56% කි. (3) 60% කි. (4) 75% කි. (5) 93.3% කි.

46. ආර්ථික වෘද්ධිය සාමාන්‍යයෙන් මනිනු ලබනුයේ පහත සඳහන් විචල්‍යයක වාර්ෂික වෙනස්වීම් ඇසුරෙනි. එම විචල්‍යය වනුයේ,

(1) පාරිභෝගික මිල දර්ශකය (2) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
(3) නිෂ්පාදන කර්මාන්ත අංශයේ නිමැවුම (4) පරිභෝජන වියදම
(5) ආයෝජන අනුපාතිකය

47. ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාතය නිර්වචනය කෙරෙනුයේ,

(1) වැඩිහිටි ජනගහනයට සාපේක්ෂ ව, ළමා ජනගහනයේ ප්‍රමාණය වශයෙනි.
(2) සේවා නියුක්ත ජනගහනයට සාපේක්ෂ ව, සේවා වියුක්ත ජනගහනයේ ප්‍රතිශතය වශයෙනි.
(3) වැඩ නො කරන වයසේ ජනගහනයේ ප්‍රමාණය, වැඩ කරන වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙනි.
(4) වයස අවුරුදු 65 ට වඩා වැඩි ජනගහන ප්‍රතිශතය වශයෙනි.
(5) අවුරුදු 15 ට අඩු හා අවුරුදු 64 ට වැඩි ජනගහන ප්‍රතිශතය වශයෙනි.

48. මානව සංවර්ධන දර්ශකයෙහි සංරචකයක් වනුයේ,

(1) වසර 12 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කළ ජනගහන ප්‍රතිශතයයි.
(2) දෛනික ප්‍රෝටීන පරිභෝජනයේ මධ්‍යන අගයයි.
(3) උපතේ දී ආයු අපේක්ෂාවයි.
(4) වැඩිහිටි සාක්ෂරතාවයි.
(5) ජනගහනයෙන් 1 000 ට සිටින වෛද්‍යවරු සංඛ්‍යාවයි.

49. BRICS රටවල් ලෙස ගැනෙනුයේ,

(1) බංග්ලාදේශය, රුසියාව, ඉන්දියාව, චීනය හා දකුණු කොරියාවයි.
(2) බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය හා දකුණු කොරියාවයි.
(3) බංග්ලාදේශය, රුසියාව, ඉන්දියාව, චීනය සහ සිංගප්පූරුවයි.
(4) බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාවයි.
(5) බ්‍රසීලය, රුසියාව, ඉන්දුනීසියාව, චීනය සහ දකුණු කොරියාවයි.

50. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ඉහළ ම දරිද්‍රතා දර්ශක අගය පෙන්නුම් කරන පළාත වනුයේ,

(1) උතුරු පළාත ය. (2) නැගෙනහිර පළාත ය.
(3) වයඹ පළාත ය. (4) ඌව පළාත ය.
(5) සබරගමු පළාත ය.

❊ ❊ ❊

www.SamithAlwis.wordpress.com


2.1.3. **I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 4 | 26. | 2 |
| 02. | 3 | 27. | 4 |
| 03. | 2 | 28. | 5 |
| 04. | 5 | 29. | 5 |
| 05. | 1 | 30. | 1 |
| 06. | 3 | 31. | 3 |
| 07. | 4 | 32. | 3 |
| 08. | 1 | 33. | 3 |
| 09. | 5 | 34. | 2 |
| 10. | 4 | 35. | 1 |
| 11. | 4 | 36. | 3 |
| 12. | 1 | 37. | 2 |
| 13. | 2 | 38. | 4 |
| 14. | 1 | 39. | 3 |
| 15. | 4 | 40. | 2 |
| 16. | 1 | 41. | 4 |
| 17. | 4 | 42. | 1 |
| 18. | 4 | 43. | 1 |
| 19. | 1 | 44. | 2 |
| 20. | 2 | 45. | 3 |
| 21. | 1 | 46. | 2 |
| 22. | 2 | 47. | 3 |
| 23. | 5 | 48. | 3 |
| 24. | 4 | 49. | 4 |
| 25. | 3 | 50. | 2 |

www.SamithAlwis.wordpress.com

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 100 කි.**

### 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ




ඉහත ප්‍රස්තාරයට අනුව, I ප්‍රශ්න පත්‍රය සැළකීමේ දී පහසුතාව අඩුම ප්‍රශ්නය වශයෙන් 47 වන ප්‍රශ්නය වේ. එහි පහසුතාව 24%කි. එසේම පහසුතාවයෙන් වැඩිම ප්‍රශ්නය වන්නේ, 01 ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 93%කි.

සමස්ත ප්‍රශ්න පත්‍රය සැළකීමේ දී I ප්‍රශ්න පත්‍රය සඳහා සමස්ත පහසුතාව 56.45%ක් වේ.

www.SamithAlwis.wordpress.com

### 2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | Missing |
| 1 | 4 | 2% | 3% | 1% | **93%** | 1% | - |
| 2 | 3 | 2% | 28% | **53%** | 15% | 2% | - |
| 3 | 2 | 18% | **43%** | 15% | 16% | 8% | - |
| 4 | 5 | 7% | 8% | 7% | 12% | **66%** | - |
| 5 | 1 | **76%** | 10% | 4% | 8% | 2% | - |
| 6 | 3 | 4% | 18% | **71%** | 5% | 1% | 1% |
| 7 | 4 | 21% | 8% | 11% | **55%** | 5% | - |
| 8 | 1 | **54%** | 5% | 15% | 8% | 18% | - |
| 9 | 5 | 4% | 19% | 9% | 23% | **45%** | - |
| 10 | 4 | 10% | 15% | 11% | **56%** | 8% | - |
| 11 | 4 | 5% | 9% | 19% | **62%** | 4% | 1% |
| 12 | 1 | **41%** | 16% | 23% | 7% | 13% | - |
| 13 | 2 | 11% | **74%** | 5% | 9% | 1% | - |
| 14 | 1 | **63%** | 10% | 12% | 5% | 9% | 1% |
| 15 | 4 | 4% | 3% | 5% | **80%** | 8% | - |
| 16 | 1 | **50%** | 23% | 7% | 13% | 6% | 1% |
| 17 | 4 | 14% | 18% | 11% | **52%** | 5% | - |
| 18 | 4 | 4% | 1% | 3% | **76%** | 16% | - |
| 19 | 1 | **73%** | 6% | 9% | 5% | 6% | 1% |
| 20 | 2 | 12% | **48%** | 9% | 14% | 16% | 1% |
| 21 | 1 | **57%** | 16% | 10% | 6% | 10% | 1% |
| 22 | 2 | 8% | **63%** | 11% | 12% | 6% | - |
| 23 | 5 | 3% | 10% | 18% | 14% | **55%** | - |
| 24 | 4 | 37% | 4% | 15% | **32%** | 11% | 1% |
| 25 | 3 | 10% | 8% | **71%** | 5% | 5% | 1% |
| 26 | 2 | 18% | **51%** | 16% | 6% | 8% | 1% |
| 27 | 4 | 18% | 15% | 3% | **62%** | 2% | - |
| 28 | 5 | 5% | 3% | 9% | 6% | **77%** | - |
| 29 | 5 | 11% | 20% | 24% | 11% | **33%** | 1% |
| 30 | 1 | **40%** | 11% | 14% | 16% | 19% | - |
| 31 | 3 | 6% | 17% | **73%** | 3% | 1% | - |
| 32 | 3 | 7% | 5% | **69%** | 16% | 3% | - |
| 33 | 3 | 9% | 9% | **35%** | 35% | 12% | - |
| 34 | 2 | 4% | **54%** | 11% | 7% | 24% | - |
| 35 | 1 | **28%** | 19% | 8% | 19% | 26% | - |
| 36 | 3 | 10% | 22% | **46%** | 18% | 4% | - |
| 37 | 2 | 15% | **68%** | 8% | 4% | 4% | 1% |
| 38 | 4 | 6% | 32% | 12% | **37%** | 13% | - |
| 39 | 3 | 9% | 13% | **43%** | 10% | 24% | 1% |
| 40 | 2 | 5% | **49%** | 8% | 17% | 21% | - |
| 41 | 4 | 8% | 10% | 34% | **39%** | 9% | - |
| 42 | 1 | **65%** | 10% | 3% | 2% | 20% | - |
| 43 | 1 | **48%** | 7% | 25% | 8% | 11% | 1% |
| 44 | 2 | 19% | **72%** | 4% | 2% | 3% | - |
| 45 | 3 | 5% | 16% | **61%** | 6% | 11% | 1% |
| 46 | 2 | 7% | **82%** | 5% | 2% | 4% | - |
| 47 | 3 | 7% | 10% | **24%** | 3% | 56% | - |
| 48 | 3 | 8% | 5% | **69%** | 15% | 3% | - |
| 49 | 4 | 4% | 22% | 13% | **55%** | 6% | - |
| 50 | 2 | 25% | **33%** | 7% | 26% | 9% | - |

www.SamithAlwis.wordpress.com

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතයයි.

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- සමස්තයක් ලෙස ගෙන බලන විට බහුවරණ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01,05,06,13,15,18,19,25, 28,31,44,46 යන ප්‍රශ්න සඳහා 70%කට ඉහළ සාධන මට්ටමක් පෙන්වා ඇත.

- ප්‍රශ්න අංක 3,9,12,20,24,29,30,33,35,36,38,39,40,41,43,47,50 යන ප්‍රශ්න සඳහා 50%කට අඩු සාධන මට්ටමක් පෙන්වා ඇත.

- 03 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වන දෙවන වරණය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 43%කි. මෙය නිෂ්පාදන සම්පත්වල ස්වභාවය මත ආවස්ථික පිරිවැය හැසිරීමත්, ඒ අනුව නිෂ්පාදන හැකියා මායිමේ හැඩය තීරණය වීමත් පිළිබඳ දැනුම මැනීමට යොමු වූ ප්‍රශ්නයකි. ඉහත කී සාධක තුන අතර සම්බන්ධය පිළිබඳව ශිෂ්‍යයාගේ අවබෝධය ප්‍රමාණවත් නොවන බවක් පෙනී යන අතර, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී මේ සම්බන්ධය අවධාරණය කිරීමේ අවශ්‍යතාවක් ඇත.

- 09 සහ 12 ප්‍රශ්න සඳහා 55%කට ආසන්න ප්‍රතිශතයක් නිවැරදි වරණය හඳුනා ගෙන නැත. මෙම ගැටලුව මිල ඉල්ලුම් නම්‍යතාව මත භාණ්ඩයක මිල වෙනස් වීම හමුවේ පාරිභෝගික පැහැදම/නිෂ්පාදක අයභාරය වෙනස්වන ආකාරය පිළිබඳව දැනුම පිරික්සීමට යොමු වී ඇත. මිල වෙනස් වීම, මිල ඉල්ලුම් නම්‍යතාව, ඒ අනුව පැහැදම වෙනස් වීම අතර අන්තර් සම්බන්ධතා හඳුනාගත නොහැකි වීම මෙම දුර්වලතාවයන්ට හේතුව බව පෙනේ. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙම අන්තර් සම්බන්ධතාව අවධාරණය කිරීම අවශ්‍ය වේ.

- 20 වැනි ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේදී 52%ක ප්‍රතිශතයක් අසමත් වී ඇත. ප්‍රශ්නය නිවැරදි ව කියවා අවබෝධ කර නොගැනීම මීට ප්‍රධාන හේතුවයි. ජාතික ගිණුම් තුළට ඇතුළත් විය යුතු එළඳායී ආර්ථික ක්‍රියා සහ බැහැර කෙරෙන දෑ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට ශිෂ්‍යයින් තවදුරටත් හුරු කළ යුතුය.

- 24 ප්‍රශ්නයෙන් පරීක්ෂා කරනු ලබන්නේ ස්වායත්ත වියදමක වෙනස්වීමට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතයේ වෙනස ඇසුරින් ගුණකය තීරණය කොට, එමගින් ආන්තික ඉතුරුම් නැඹියාව හා ආන්තික පරිභෝජන නැඹියාව ගණනය කිරීමේ හැකියාවයි. අපේක්ෂකයන්ගෙන් 68%ක් නිවැරදි වරණය තෝරා ගැනීමට අසමත් වීමෙන් පෙනී යන්නේ ඉහත කරුණු පිළිබඳව දැනුම හා භාවිතය පිළිබඳ කුසලතාව නොමැති බවයි. ප්‍රශ්නයෙන් අසා ඇති දේ සියුම් ව හඳුනා ගෙන පිළිතුරු සැපයීමට ශිෂ්‍යයා හුරු කළ යුතු ය.

- 29 ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරා ගෙන ඇත්තේ 33%ක් පමණි. එහි 2 වන හා 3 වන වරණ සඳහා ප්‍රතිචාර දක්වා ඇති ප්‍රතිශතය 44%ක් වීමෙන් පැහැදිලි වන කරුණු කිහිපයකි.
  - මුදල් ගුණකය ගණනය කිරීමේ නොහැකියාව
  - මුදල් පදනමට සහ මුදල් සැපයුමට අයත් සංරචක පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති වීම
  - මුදල් ගුණකය පිළිබඳ සංකල්පමය දැනුම නොතිබීම

  ඉහත දුර්වලතා ඉවත් වන ආකාරයට දැනුම ලබා දීම හා අභ්‍යාසයේ යෙදවීම අවශ්‍ය බව පෙනී යයි.

- 30 වන ප්‍රශ්නයෙන් මහ බැංකුව විසින් මුදල් වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාව කළමනාකරණය කරන ආකාරය සහ ඒ අනුව බැංකු පද්ධතියේ සංචිත මට්ටම, මුදල් පදනම හැසිරෙන ආකාරය පරීක්ෂා කරයි. අපේක්ෂකයන්ගෙන් 60%ක් නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී ඇත. එයට හේතුව මහ බැංකුවේ විවට වෙළෙඳපොළ කටයුතු සමග පදනම් මුදල් වෙනස් වන ආකාරය ශිෂ්‍යයා විසින් හඳුනාගෙන නොතිබීමයි. මෙම ක්‍රියාකාරිත්වය පිළිබඳව අවබෝධය ශිෂ්‍යයා වෙත ලැබෙන පරිදි අභ්‍යාස කරවීමට උනන්දු විය යුතුය.

www.SanathAlwis.wordpress.com

★ 33 ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරෙන්නේ නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක විකල්ප අරමුණු අතර, හිඟ සම්පත් බෙදා වෙන් කිරීමේදී වෙළෙඳපොළ අසාර්ථක වීමට බලපාන හේතු කවරේද යන්නයි. එහෙත් සිසුන් පිළිතුරු සැපයීමේදී වෙළෙඳපොළ අසමත් වීමට බලපාන හේතු ද පිළිතුර ලෙස හඳුනා ගැනීමෙන් නිවැරදි පිළිතුර වන 03 වන වරණයට හා 4 වන වරණයට 35% බැගින් පිළිතුරු සපයා ඇත. එබැවින් පොදුවේ වෙළෙඳපොළ අසමත් වීමට බලපාන හේතු සහ සම්පත් ප්‍රශස්ත ලෙස බෙදා හැරීම තීරණය කරන සාධක සුවිශේෂ ලෙස හඳුනා ගත යුතුය.

★ 35 වැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී නිවැරදි වරණයට සිසුන්ගෙන් 28%ක් ද 5 වැනි වරණයට 26%ක් ද ප්‍රතිචාර දක්වා ඇත. වැරදි වරණය වෙත යොමු වීමට හේතුව වී ඇත්තේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ නිවැරදිව හඳුනා ගෙන නොතිබීමයි. මෙම ප්‍රතිපත්තිවල වෙනස හා ඊට අදාළ උපකරණ වල වෙනස අවධාරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් විය යුතුය.

★ 36 හා 39 සාපේක්ෂ හා නිරපේක්ෂ වාසි මත කුමන රටක් කුමන භාණ්ඩයක් විශේෂීකරණය කළ යුතු ද යන්න පිළිබඳව දැනුම පරීක්ෂා කෙරෙන්නකි. සම්පත් ඒකකයක නිමැවුම් හැකියාව දී ඇති විට හා නිමැවුම් ඒකකයකට පිරිවැය අගයන් දී ඇති විට ආවස්ථික පිරිවැය ගණනය කළ යුතු ආකාරය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබීම මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී සිසුන් අසමත් වීමට හේතු වී ඇත. එසේ අසමත් වී ඇති ප්‍රතිශතය පිළිවෙලින් 54%ක් හා 57%කි.

★ 38 වැනි ප්‍රශ්නයට නිවැරදි වරණය තෝරා ගෙන ඇත්තේ 37%ක් වැනි සුළු ප්‍රතිශතයකි. මෙහිදී 63%ක ප්‍රතිශතයක් අසාර්ථක වීමට හේතුව ලෙස පෙනී යන්නේ ආනයන සහ අපනයන යන සංකල්ප හා එම වටිනාකම්වල විශාලත්වය මත වෙළෙඳ ගිණුමේ ශේෂය හිඟයක් ද අතිරික්තයක් ද යන්න පිළිබඳව අවබෝධය ප්‍රමාණවත් නොවීමයි. එබැවින් සංකල්ප අතර අවබෝධය ඇති කිරීමට කටයුතු කිරීම වැදගත් වේ.

★ 41 හා 43 ප්‍රශ්න විනිමය අනුපාතිකය පිළිබඳව අවබෝධය පරීක්ෂා කෙරෙන ප්‍රශ්න වේ. 41 ප්‍රශ්නය සඳහා 39%ක් ද, 43 ප්‍රශ්නයට 48%ක් ද සාර්ථකව පිළිතුරු සපයා ඇත. 41 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අසාර්ථක වීමට හේතුව නම්‍ය විනිමය අනුපාතිකය හා ස්ථාවර විනිමය අනුපාතිකය පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීමයි. 43 ප්‍රශ්නයේදී නාමික විනිමය අනුපාතිකය හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය අතර වෙනස නිවැරදිව හඳුනා නොගැනීම නිසා පිළිතුරු අසාර්ථක වී ඇත. සාපේක්ෂ වශයෙන් දුෂ්කර විෂය කොටසක් වන මෙම සංකල්ප අතර වෙනස අවධාරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අවශ්‍ය බව පෙනේ.

★ 47 ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ යැපුම් අනුපාතය නිර්වචනය කරන ආකාරය පිළිබඳවයි. විභාග අපේක්ෂකයන්ගෙන් 24%ක් නිවැරදි වරණය තෝරාගෙන ඇති අතර, 56%ක් 4 වන වරණය වෙත යොමු වීමෙන් පෙනී යන්නේ යැපුම් අනුපාතය සකස් කිරීමේ නිවැරදි ක්‍රමය හරි හැටි අවබෝධ කොට ගෙන නොමැති බවය. නිවැරදිව යැපුම් අනුපාතය පිළිබඳ න්‍යායාත්මක ප්‍රවේශය සහ ශ්‍රී ලංකාවේ එවැනි අනුපාත ගණනය කිරීමේදී යොදා ගැනෙණ ප්‍රායෝගික ප්‍රවේශයන් පිළිබඳ සිසුන්හට අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

★ 50 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන්ගෙන් 50%ක් නිවැරදි වරණය තෝරා ගෙන ඇති නමුත් වැරදි පිළිතුරු සඳහා සිසුන් යොමු වී ඇත්තේ දරිද්‍රතාවයේ ප්‍රාදේශීය විෂමතා පිළිබඳව යාවත්කාලීන තොරතුරු නොදන්නා බැවිනි. නිවැරදි තොරතුරු යාවත්කාලීන කර ගැනීමට සිසුන් උනන්දු කරවිය යුතුය.

www.SamanthAlwis.wordpress.com

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

'අ' උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

'ආ' උප කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම.

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| II පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| අවසාන ලකුණ 200 ÷ 2 | | = | 100 |

www.SamithAlwis.wordpress.com

**2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ නිගමන හා යෝජනා**

★ **II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3, 4.1 සහ 4.2 ඇසුරින් ඉදිරිපත් කර ඇත.**

01 ප්‍රශ්නය

**"අ" උප කොටස**

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

**1. (i) ආර්ථික සම්පත් ඔබ නිර්වචනය කරන්නේ කෙසේ ද? ඔබ ඒවා වර්ගීකරණය කරනු ලබන්නේ කෙසේ ද?** *(ලකුණු 04 යි)*

**(ii) ව්‍යවසායකයාගේ ප්‍රධාන කාර්යයන් කවරේ ද?** *(ලකුණු 04 යි)*

**(iii) නිෂ්පාදන කාර්යක්ෂමතාව (productive efficiency) සහ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව (allocative efficiency) අතර වෙනස පෙන්වා දෙන්න.** *(ලකුණු 04 යි)*

**(iv) ආවස්ථික පිරිවැය සංකල්පය පැහැදිලි කොට, හිඟ සම්පත්වල විකල්ප භාවිත අතර තේරීමේ ප්‍රශ්නයට, එය සම්බන්ධ වන්නේ කෙසේ දැ යි විස්තර කරන්න.** *(ලකුණු 04 යි)*

**(v) විධානගත ආර්ථිකයක් (command economy) සහ වෙළෙඳපොළ ආර්ථිකයක් අතර දක්නට ලැබෙන වෙනස්කම් සඳහන් කරන්න.** *(ලකුණු 04 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i) - සමාජයේ අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව, සැපයුම සීමාසහිත හෝ හිඟකමක් හෝ ඇති නිෂ්පාදන සාධක "ආර්ථික සම්පත්" යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලකුණු 1යි)

- හිඟකම ආර්ථික සම්පත්වල මූලික ලක්ෂණය වන බැවින්, ආර්ථික සම්පත් උපයෝජනය කිරීමේදී ආවස්ථික පිරිවැයක් හටගනී. (ලකුණු 1යි)

- ආර්ථික සම්පත් වර්ගීකරණය
  - භූමිය
  - ශ්‍රමය
  - ප්‍රාග්ධනය
  - ව්‍යවසායකත්වය (ලකුණු 2යි)

(ව්‍යවසායකත්වය සඳහන් නොකොට සෙසු සාධක 3 පමණක් සඳහන් කොට ඇත්නම්, ලැබෙනුයේ ලකුණු 01ක් පමණි.)

[සම්පත් වර්ගීකරණය පිළිබඳ විකල්ප පිළිතුරක්:
- දේපොළ සම්පත් : ස්වභාවික සම්පත් හා ප්‍රාග්ධනය
- මානව සම්පත් : ශ්‍රමය හා ව්‍යවසායකත්වය (ලකුණු 2යි)]

(ii) - භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීම සඳහා භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාධක මිශ්‍ර කරමින් නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානය කිරීම.

- ව්‍යාපාරික ප්‍රතිපත්තිය පිළිබඳ මූලික තීරණ ගැනීම.
(මේවා ව්‍යාපාරය පිළිබඳව එදිනෙදා ගනු ලබන තීරණ නොව, ව්‍යාපාරයේ මූලික ගමන් මඟ පිළිබඳව ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ය.)

- නව්‍යතා හඳුන්වාදීම.
(අළුත් නිෂ්පාදිත, අළුත් නිෂ්පාදන ක්‍රම, අළුත් ව්‍යාපාර ස්වරූපයන් වාණිජ පදනමකින් හඳුන්වා දෙනු ලැබේ.)

- අවදානම් දැරීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)

www.SamithAlwis.wordpress.com

(iii) - නිෂ්පාදන කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කෙරෙනුයේ, අවම නිෂ්පාදන පිරිවැයක් යටතේ අදාළ භාණ්ඩ හා සේවා සංයෝජනය නිෂ්පාදනය කිරීමය. (එනම් දෙන ලද යෙදවුම් ප්‍රමාණයකින් උපරිම නිමැවුමක් ලබා ගැනීම හෝ දෙන ලද නිමැවුමක් අවම යෙදවුම් ප්‍රමාණයකින් නිපදවීම හෝ මින් අදහස් වේ.)

(ලකුණු 01යි)

- නිෂ්පාදන කාර්යක්ෂමතාව සඳහා පූර්ණසේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය අවශ්‍ය කරන බැවින්, එම තත්ත්වය යටතේ ආර්ථිකය හැම විටම නිෂ්පාදන හැකියා වක්‍රය මත ලක්ෂ්‍යයක කටයුතු කරනු ඇත.

(ලකුණු 01යි)

[විකල්ප පිළිතුරු:
ආර්ථිකයට, වෙනත් භාණ්ඩයක නිෂ්පාදනය අඩු නොකොට කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කළ නොහැකි තත්ත්වයක් පවතී නම්, එහිදී නිෂ්පාදන කාර්යක්ෂමතාව හට ගනී. මින් හැඟවෙන්නේ ආර්ථිකය නිෂ්පාදන හැකියා වක්‍රය මත සිටින බවය.

(ලකුණු 2යි)]

- සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කෙරෙනුයේ සමාජයට වඩාත් අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා සංයෝජනය නිෂ්පාදනය කිරීම සඳහා ආර්ථිකයේ හිඟ සම්පත් බෙදා වෙන් කළ යුතු බවය.

(ලකුණු 01යි)

- මින් හැඟැවෙන්නේ ආර්ථිකය නිෂ්පාදන හැකියා වක්‍රය මත ප්‍රශස්ත ලක්ෂ්‍යයක කටයුතු කරන බවය. (මෙම ප්‍රශස්ත තත්ත්වය ළඟා වනුයේ එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආන්තික පිරිවැය, එම භාණ්ඩයේ මිලට සමාන විටදීය, එනම් MC=P)

(ලකුණු 01යි)

[විකල්ප පිළිතුරු:
- නිෂ්පාදන කාර්යක්ෂමතාව යනු සියළුම නිමැවුම් සංයෝජන අවම පිරිවැයකින් නිෂ්පාදනය කිරීමය. එහිදී ආර්ථිකය නිෂ්පාදන හැකියා වක්‍රය මත කටයුතු කරයි.

(ලකුණු 2යි)]

- සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව යනු සමාජයට වඩාත් අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා හිඟ සම්පත් යොදා ගැනීමය. මෙම තත්ත්වය යටතේ ආර්ථිකය, නිෂ්පාදන හැකියා වක්‍රය මත ප්‍රශස්ත ලක්ෂ්‍යයක කටයුතු කරන අතර, එහිදී සෑම භාණ්ඩයකම ආන්තික පිරිවැය ඒවායේ ආන්තික ප්‍රතිලාභවලට සමාන වනු ඇත.

(ලකුණු 2යි)]

www.SamithAlwis.wordpress.com

(iv) - නිෂ්පාදනය හෝ පරිභෝජනය පිළිබඳ විකල්ප හමුවේ කිසියම් තේරීමක් කරන විට, ඒ වෙනුවෙන් කැප කිරීමට සිදුවන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය වේ.

- ආවස්ථික පිරිවැය ආත්මගත සංකල්පයක් වන අතර, තේරීමක් කිරීමේදී කැප කරන ලද හොඳම විකල්පයේ වටිනාකම කුමක්දැයි කිවහැක්කේ තේරීම කරනු ලබන පුද්ගලයාට පමණි.

- ආවස්ථික පිරිවැය මනිනුයේ මූල්‍ය ඒකක වලින් නොව, ද්‍රව්‍යමය ඒකකවලිනි. එය මුදල් පිරිවැයෙන් වෙනස් වූ මූර්ත ආවස්ථික පිරිවැයකි.

- සාමාන්‍යයෙන් ආවස්ථික පිරිවැය ධන අගයක් ගනී. කිසියම් භාණ්ඩයක් වැඩියෙන් නිපදවීම සඳහා තවත් භාණ්ඩයක නිෂ්පාදන අඩු කළ යුතු වේ. එහෙත් ආවස්ථික පිරිවැය ශූන්‍ය විය හැකි විශේෂ අවස්ථා ද පවතී.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 02කට ලකුණු 02යි)**

- හිඟකම පවතින විට අවශ්‍යයෙන්ම තේරීම් කිරීමට සිදුවේ. තේරීම කරන විට සිදුවන වැදගත්ම කරුණ වන්නේ කැප කිරීම් කිරීමට සිදුවීමය. තේරීම් කරන විට මෙලෙස පැහැර ගැනීමට හෙවත් කැප කිරීමට සිදුවන අවස්ථාව අදාළ තීරණයේ ආවස්ථික පිරිවැය වේ.

**(ලකුණු 2යි)**


(v) විධානගත ආර්ථිකයක් හා වෙළෙඳපොළ ආර්ථිකයක් අතර වෙනස්කම්:

| විධානගත ආර්ථිකය | වෙළෙඳපොළ ආර්ථිකය |
|---|---|
| - මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳ තීරණ ගැනීම මධ්‍යගතව පවතී. | - මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳ තීරණ ගැනීම විමධ්‍යගතව පවතී. |
| - මධ්‍යගත සැලසුම්කරණය | - මිල යන්ත්‍රණය |
| - දේපොළ පිළිබඳ රාජ්‍ය හිමිකම | - දේපොළ පිළිබඳ පෞද්ගලික හිමිකම |
| - රාජ්‍ය ව්‍යවසාය | - පෞද්ගලික ව්‍යවසාය |
| - ව්‍යාපාර පිළිබඳ රාජ්‍ය ඒකාධිකාරය | - ව්‍යාපාර කරගෙන යාමේ නිදහස |
| - සමාජ සුභසාධනය අරමුණු කරගෙන මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳ තීරණ ගනී. | - ස්වාර්ථය අරමුණු කරගෙන මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳ තීරණ ගනී. |
| - ආර්ථිකය මත රාජ්‍ය හස්තය පැතිර තිබීම. | - ආර්ථිකය තුළ රජයේ කාර්යය භාරය අතිශයින් සීමිත වීම. (රාජ්‍ය නිර්බාධ වාදය) |
| - බලය පදනම්කරගත් සානුබල පැවතීම. | - ස්වාර්ථය හා ද්‍රව්‍යාත්මක ප්‍රතිලාභ පදනම් කරගත් සානුබල පැවතීම. |


**(එක් වෙනසකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

www.SamithAlwis.wordpress.com

01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




01 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 95%ක් පමණ පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 16%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 34%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයට අනුකොටස් 05ක් ඇති අතර, එම අනු කොටස් පහේම පහසුතාව 45%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 46%කි. එමෙන්ම (ii) අනු කොටස පහසුම කොටස වී ඇති අතර, එහි පහසුතාව 68%කි.

- i අනු කොටස සඳහා පහසුතාව 52%කි. ආර්ථික සම්පත් නිවැරදිව නිර්වචනය කිරීමේ අපහසුතාව හා ආර්ථික සම්පත් වර්ග කිරීමේ නිවැරදි ක්‍රමය පිළිබඳව අවබෝධය මඳබව මීට හේතුව වේ. ආර්ථික සම්පත් නිවැරදිව නිර්වචනය කිරීමේ හා එම සම්පත් විකල්ප ක්‍රම ඔස්සේ වර්ග කිරීමේ අවබෝධය හා කුසලතාව ලබා දිය යුතුය.

- ii අනු කොටස සඳහා පහසුතාව 68%කි. ව්‍යවසායකයාගේ ප්‍රධාන කාර්යයන් විස්තර කිරීම, ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන අතර, ඒ පිළිබඳව පවතින දුෂ්කරතාවට හේතු වී ඇත්තේ ව්‍යවසායකයාගේ කාර්යයන් පිළිබඳව සිසුන් නිවැරදිව දැනුවත් වී නොමැති වීමයි. ප්‍රායෝගික නිදසුන් මගින් ව්‍යවසායකයාගේ කාර්ය භාරය විස්තර කළ යුතු වේ.

- iii අනු කොටස සඳහා පහසුතාව 46%කි. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස පෙන්වා දීමේ දුෂ්කරතාව 54%ක් පමණ මට්ටමක පැවතීම සතුටුදායක නොවේ. එම න්‍යායාත්මක සංකල්ප නිවැරදිව නිර්වචනය කොට ඒ සඳහා අවශ්‍ය කොන්දේසි දක්වමින් වෙනස්කම් අවධාරණය කළ යුතුය.

- iv අනු කොටස සඳහා පහසුතාව 58%කි. එම කොටස මගින් ආවස්ථික පිරිවැය සංකල්පය පැහැදිලි කිරීම සහ හිඟ සම්පත්වල විකල්ප භාවිත අතර තේරීම් ඊට සම්බන්ධ වන ආකාරය විග්‍රහ කිරීම, අපේක්ෂා කරනු ලබයි. මෙම ප්‍රශ්නයේ දුෂ්කරතාව කෙරෙහි බලපා ඇත්තේ ආවස්ථික පිරිවැය ඇගයීමේදී අවධාරණය කළ යුතු මූලිකාංග පිළිබඳ අවබෝධය නොමැති වීමයි. එබැවින් සම්පත් හිඟ වීම, ඒවායේ විවිධ භාවිතයන් පැවතීම හා අසීමිත මිනිස් වුවමනා අතර තේරීම් කිරීම නිසා ආවස්ථික පිරිවැය හටගන්නා බව උදාහරණ ඇසුරින් පැහැදිලි කළ යුතුය.

- v අනු කොටස සඳහා පහසුතාව 66%කි. මෙම කොටසින් බලාපොරොත්තු වන්නේ විධානගත ආර්ථිකයක් සහ වෙළෙඳපොළ ආර්ථිකයක් අතර දක්නට ලැබෙන වෙනස්කම් විස්තර කිරීමය. මෙම ගැටලුවෙහි යම් දුෂ්කරතාවයන්ට හේතු වී තිබෙන්නේ ආර්ථික පද්ධතීන් අතර වෙනස්කම් නිශ්චිත කරුණු ඔස්සේ තුළනාත්මකව සැසඳීමේ දැනුම හා කුසලතාව නොමැති වීමය. ඒ පිළිබඳ සාකච්ඡාවට අවස්ථාව ලබා දෙමින් කුසලතා ඇති කිරීම වැදගත් වේ.

www.SamithAlwis.wordpress.com

## 02 ප්‍රශ්නය

**2. (i) 'ඉල්ලුම් නීතිය', පැහැදිලි කරන්න. ඉල්ලුම් වක්‍රයක් පහළට බෑවුම් වන්නේ ඇයි?** *(ලකුණු 04 යි)*

**(ii) එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත සඳහන් සමීකරණවලින් විස්තර කෙරෙන බව සලකන්න.**

$Q_d = 50 - 5P$

$Q_s = -10 + 5P$

**මෙම සමීකරණ විසඳ, සමතුලිත මිල හා ප්‍රමාණය නිර්ණය කරන්න.** *(ලකුණු 04 යි)*

**(iii) සමතුලිත මිලේ දී ඉල්ලුමේ මිල නම්‍යතාව ගණනය කරන්න.** *(ලකුණු 02 යි)*

**(iv) මෙම වෙළෙඳපොළ තුළ සිටින නිෂ්පාදකයන්ට, ඒකකයකට රු. 8 ක් බැගින් වූ සහතික මිලක් ලබා දීමට රජය දැන් තීරණය කොට තිබේ යයි සලකන්න. මෙම මිල ආධාරක ප්‍රතිපත්තිය වෙනුවෙන් රජයට දැරීමට සිදුවන මුළු පිරිවැය කොපමණ වේ ද?** *(ලකුණු 04 යි)*

**(v) සහතික මිල හඳුන්වා දුන් පසුව, පාරිභෝගික අතිරික්තයෙහි සහ නිෂ්පාදක අතිරික්තයෙහි ප්‍රමාණය ඇස්තමේන්තු කරන්න.** *(ලකුණු 06 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(2) (i) - යම් දෙන ලද අවස්ථාවක, ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, සලකා බලන භාණ්ඩයේ මිල හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් තිබීම ඉල්ලුම් නීතිය නම් වේ. (ලකුණු 02යි)

- ආදේශන ප්‍රතිවිපාකය (ලකුණු 01යි)

- ආදායම් ප්‍රතිවිපාක (ලකුණු 01යි)

(ii) - $Q_d$ - $Q_s$ $50 - 5P = -10 + 5P$

$60 = 10P$

සමතුලිත මිල $P = 6$ (ලකුණු 02යි)

සමතුලිත ප්‍රමාණය $Q = 20$ (ලකුණු 02යි)

(iii) - සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාව:

$$\frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q} = \frac{-5}{1} \times \frac{6}{20}$$ (ලකුණු 01යි)

$$= \frac{-30}{20} = -1.5$$ (ලකුණු 01යි)

(iv) - අතිරික්ත සැපයුම රජය විසින් මිලදී ගනු ලබන සහතික මිල ක්‍රමය:

- අතිරික්ත සැපයුම = ඒකකය රු.8 දී සපයනු ලබන ප්‍රමාණය - රු. 8 දී ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය

$Q_s = -10 + 5(8) = 30$; $Q_d = 50 - 5(8) = 10$

අතිරික්ත සැපයුම 30 - 10 = ඒකක 20කි. (ලකුණු 02යි)

ආණ්ඩුවේ වියදම $= 20 \times 8$ = රු. 160 (ලකුණු 02යි)

<u>නැතහොත්</u>

- ඌනපූරණ ගෙවීම් ක්‍රමයක් යටතේ සහතික මිල ක්‍රියාවට නැංවීම:
- ඒකකයක් රුපියල් 8දී මුළු සැපයුම $= Q_s = -10 + 5(8) = 30$
- ඒකක 30ක් වෙළෙඳපොළට සපයනු ලබන විට වෙළෙඳපොළේ මිල }

$Q_s = Q_d$

$30 = 50 - 5P$

$5P = 20$

P = රු. 4.00

www.SamithAlwis.wordpress.com

- ඒකකයකට උෟනපූරණ ගෙවීම = සහතික මිල - වෙළෙඳපොළ මිල
= 8 - 4
= රු. 4.00 (ලකුණු 02යි)

- උෟනපූරණ ගෙවීම සඳහා ආණ්ඩුවේ වියදම = $30 \times 4$
= රු. 120 (ලකුණු 02යි)

(v) **- අතිරික්ත සැපයුම ආණ්ඩුව විසින් මිලදී ගන්නා සහතික මිලක් යටතේ පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත:**

<u>පාරිභෝගික අතිරික්තය:</u>

ඉල්ලුම ශූන්‍ය වන මිල = 0 = 50 - 5P = රු. 10.00 (ලකුණු 01යි)

සහතික මිල = රු. 8.00

සහතික මිලේදී ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය = $Q_d$ = 50 - 5 (8)
= ඒකක 10

පාරිභෝගික අතිරික්තය = $\frac{(10 - 8) \times 10}{2} = \frac{20}{2} = 10$ (ලකුණු 02යි)

<u>නිෂ්පාදක අතිරිත්කය:</u>

ඉල්ලුම ශූන්‍ය වන මිල = 0 = 10 + 5P = රු. 2.00 (ලකුණු 02යි)

සහතික මිල = රු. 8.00

සහතික මිලේදී සපයනු ලබන ප්‍රමාණය = $Q_3$ = - 10 + 5 (8)
= ඒකක 30

නිෂ්පාදක අතිරික්තය = $\frac{(8 - 2) \times 30}{2} = \frac{180}{2} = 90$ (ලකුණු 02යි)

<u>නැතහොත්</u>

**- උෟනපූරණ ගෙවීම් ක්‍රමයක් යටතේ පාරිභෝගික සහ නිෂ්පාදක අතිරික්ත:**

<u>පාරිභෝගික අතිරික්තය:</u>

ඉල්ලුම ශූන්‍ය වන මිල = 0 = 50 - 5P = රු. 10.00 (ලකුණු 01යි)

සැපයුම 30ක් වනවිට වෙළෙඳපොළ මිල = රු. 4.00

වෙළෙඳපොළ මිල රු. 4දී ඉල්ලුම = $Q_d$ = 50 - 5 (4) = 30

පාරිභෝගික අතිරික්තය = $\frac{(10 - 4) \times 30}{2} = \frac{180}{2} = 90$ (ලකුණු 02යි)

<u>නිෂ්පාදක අතිරිත්කය:</u>

ඉල්ලුම ශූන්‍ය වන මිල = 0 - 10 + 5P = රු. 2.00 (ලකුණු 01යි)

සහතික මිල = රු. 8.00


සහතික මිලේදී සැපයුම = $Q_s$ = - 10 + 5 (8) = 30

නිෂ්පාදක අතිරික්තය = $\frac{(8 - 2) \times 30}{2} = \frac{180}{2} = 90$ (ලකුණු 02යි)


www.SamithAlwis.wordpress.com

ඇතැම් අයදුම්කරුවන් ප්‍රස්තාර සටහන් උපයෝගී කරගනිමින් පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත ගණනය කිරීමට පිළිවන. එහිදී අදාළ නිවැරදි රූප සටහන් පහත දැක්වේ.

අතිරික්තය රජය මිලදී ගන්නා විට පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්ත





ඌනපූරණ ගෙවීම් ක්‍රමයක් යටතේ පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත




## 02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




දෙවැනි ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 87%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.

www.SamithAlwis.wordpress.com

ප්‍රශ්නයේ කොටස් හා අනු කොටස්වල පහසුතාව




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 5ක් ඇති අතර අනු කොටස් පහේම පහසුතාව 45%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (v) වී ඇති අතර, එහි පහසුතාවය 46%කි. පහසුතාව වැඩිම අනුකොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 93%කි.

★ i කොටස සඳහා පහසුතාව 51%කි. ඉල්ලුම් නීතිය සහ ඒ අනුව ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම්වීමට හේතු පිළිබඳව දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නයකි. ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට, භාණ්ඩයක මිල හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධතාව අවබෝධ කරගෙන නොතිබීමත් ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වීමට බලපාන න්‍යායාත්මක සාධක වන ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය නිශ්චිතව දැක්වීමට අපොහොසත් වීම දුෂ්කරතාවයට හේතු විය. එබැවින් න්‍යායාත්මක කරුණු පිළිබඳ දැනුම අවධාරණය කළ යුතුය.

★ ii අනු කොටස සඳහා පහසුතාව 93%කි. ඉල්ලුම් හා සැපයුම් සමීකරණ විසඳීම ඇසුරින් තොරතුරු ලබා ගැනීමට යොමු වූ ගැටලුවකි. පහසු ගැටලුවක් බැවින් වැඩි දෙනෙකුට සාර්ථකව පිළිතුරු ලිවීමට හැකියාව ලැබී තිබුණි.

★ iii අනු කොටස, දෙවන කොටසින් ගණනය කරගනු ලබන සමතුලිත මිල යොදා ගනිමින් ඉල්ලුම් සමීකරණය භාවිත කර නම්‍යතාව ගණනය කිරීමේ හැකියාව මැන බැලීමට යොමු වූ ගැටලුවකි. මෙම කොටසේ පහසුතාව 64%කි. පිළිතුර නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වූ සිසුන් මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරනු ලබන සූත්‍රයට අවශ්‍ය දත්ත ආදේශ කිරීම පිළිබඳව දුර්වල බවක් පෙන්වා ඇත. එබැවින් දී ඇති දත්ත භාවිත කර නම්‍යතාව ගණනය කිරීම පිළිබඳ නිපුණතාවය ලබා දිය යුතුය.

★ iv අනු කොටස සඳහා පහසුතාව 53%කි. රජය මිල ආධාරක ප්‍රතිපත්තියක් යටතේ සහතික මිලක් ලබා දීමට ක්‍රියාකිරීමේදී දැරීමට සිදුවන පිරිවැය අතිරික්ත සැපයුම මිලට ගැනීම සහ ඌන පූරණ ගෙවීම් ක්‍රමය යන ක්‍රම දෙක අතුරින් ඕනෑම ක්‍රමයක් මගින් පිළිතුරු සැපයීමේ හැකියාව සහිත ගැටලුවකි. ප්‍රස්තාර භාවිතයකින් තොරව ගැටලුව විසඳීමට උත්සාහ දැරීම නිසා පිළිතුරු අසාර්ථක වී ඇති බව පෙනේ. එබැවින් මෙවැනි ගැටලුවලට පිළිතුරු සැපයීමේදී රූප සටහනක් නිර්මාණය කොට ඒ ඇසුරින් පිළිතුරු සැපයීමට පුහුණු කිරීමෙන් දුර්වලතා මඟ හරවා ගත හැක.

★ v අනු කොටස, හතරවන iv කොටසට පිළිතුරු සැපයීමට යොදා ගත් මිල ආධාරක ප්‍රතිපත්තියේ ස්වරූපය මත පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තය ගණනය කළ විට ලැබෙන පිළිතුරු වෙනස් වේ. මෙම කොටසේ පහසුතාව 46%කි. ඉන් පැහැදිලි වන්නේ අතිරික්ත සැපයුම සහ ඌන පූරණය කළ යුතු මිල පරතරය ගණනය කිරීමට සිසුන් අපොහොසත් වීමයි. එහෙත් ප්‍රස්තාර සටහන් නිවැරදිව සකස් කර ගැනීමට හුරුකිරීමෙන් සහ එම එක්එක් ක්‍රමයේදී පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයට අයත් ප්‍රදේශ නිවැරදිව හඳුනාගන්නා ආකාරය අභ්‍යාස මගින් පුහුණු කිරීමෙන් දුර්වලතා අවම කර ගත හැක.

## 03 ප්‍රශ්නය

**3. (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?** *(ලකුණු 02 යි)*

**(ii) 'හීනවන ඵලද නීතිය' යනු කුමක් ද? කෙටි කාලීන පිරිවැය වක්‍රවල හැඩය පිළිබඳ ව ඉන් කවරක් ගම්‍ය වනුයේ ද?** *(ලකුණු 04 යි)*

**(iii) ගණකාධිකරණ පිරිවැය සහ ආර්ථික පිරිවැය යන සංකල්ප එකිනෙකින් වෙනස් වන්නේ කෙසේ ද?** *(ලකුණු 04 යි)*

**(iv) මිල සකසන්නා (price maker) සහ මිල ගනුවා (price taker) යන සංකල්පවලින් කවරක් අදහස් වේ ද?** *(ලකුණු 04 යි)*

**(v) කතිපයාධිකාරය, ඒකාධිකාරී තරගයෙන් වෙනස් ව සැලකෙනුයේ කවර කරුණු නිසා ද?** *(ලකුණු 06 යි)*

www.SamithAlwis.wordpress.com

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(3) (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් පෙන්නුම් කරනුයේ කර්මාන්ත ශාලාවේ ධාරිතාව (Plant Size) හා නිෂ්පාදන ශිල්ප ක්‍රමය නොවෙනස්ව තිබියදී, විචල්‍ය යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනය සිදු කරන විට, යෙදවුම් හා නිමැවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාවයයි.

**(ලකුණු 02යි)**

[විකල්ප පිළිතුර:

- කර්මාන්ත ශාලාවේ ධාරිතාව හා තාක්‍ෂණය නොවෙනස්ව තිබියදී, විචල්‍ය යෙදවුම් වෙනස් කරන විට, යෙදවුම් හා නිමවුම් අතර පවතින තාක්‍ෂණික සම්බන්ධය කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය පෙන්නුම් කරයි.
  එම ශ්‍රිතය මෙලෙස ප්‍රකාශ කළ හැකිය: $Q = f(v_1, v_2, v_3 \,......... \, vn; K)$ (ලකුණු 02යි)]

(ii) - නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේදී ස්ථාවර යෙදවුම් සමඟ මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් ප්‍රමාණයක් වැඩි කරන විට, විචල්‍ය යෙදවුමේ ආන්තික හා සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ යාමට පටන් ගැනීම, **හීනවන ඵලදා නීතිය** නම් වේ.

(ලකුණු 02යි)

- කෙටි කාලීන පිරිවැය වක්‍ර හීනවන ඵලදා නීතියේ පිළිබිඹුවකි. (ලකුණු 01යි)

- විචල්‍ය සාධකයේ මිල නොවෙනස්ව තිබියදී, විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව ඉහළ යන විට ආන්තික පිරිවැය පහළ වැටේ. ආන්තික ඵලදාව හීනවීම පටන් ගන්නා විට ආන්තික පිරිවැය ද ඉහළ යාමට පටන් ගනී.

- සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය ද හීනවන ඵලදා නීතිය පිළිබිඹු කරමින් ඉංග්‍රීසි 'U' අකුරක හැඩය ගනී. (ලකුණු 01යි)

(iii) - ගණකාධිකරණ පිරිවැය ලෙස ගැනෙනුයේ නිෂ්පාදන ආයතනයක් විසින් මුදල් ගෙවා පිටතින් මිලදී ගනු ලබන යෙදවුම්වල පිරිවැය හෙවත් ඍජු පිරිවැය වේ.

(ලකුණු 02යි)

- එහෙත් ආර්ථික පිරිවැය තුළට ඍජු පිරිවැය හා ආරෝපිත පිරිවැය යන සංරචක දෙකම අයත් වේ.

(ලකුණු 02යි)

[විකල්ප පිළිතුර:

නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගනු ලබන සියලුම යෙදවුම්වල ආවස්ථික පිරිවැය ආර්ථික පිරිවැයට ඇතුළත් වන අතර, ගණකාධිකරණ පිරිවැයට ඇතුළත් කරනුයේ පිටතින් මිලදී ගත් යෙදවුම් සඳහා ආයතනය විසින් දරන ලද මූල්‍ය පිරිවැය පමණි. එබැවින් ගණකාධිකරණ පිරිවැය ලබා දෙනුයේ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය පිළිබඳ ඌන තක්සේරුවකි.

(ලකුණු 04යි)]

(iv) <u>මිල සකසන්නා:</u>

- වෙළෙඳපොළ විසින් තීරණය කරනු ලබන මිල අකර්මණ්‍යව බාර ගන්නවා වෙනුවට, භාණ්ඩයේ මිල තීරණය කිරීම සඳහා කිසියම් වෙළෙඳපොළ බලයක් ඇති නිෂ්පාදන ආයතනයක් මිල සකසන්නෙකු ලෙස සැලකේ.

- ඒකාධිකාරී හා අපූර්ණ තරඟ වෙළෙඳපොළවල කටයුතු කරන නිෂ්පාදන ආයතනවලට තම වෙළෙඳපොළ ප්‍රතිශතය මුළුමනින්ම අහිමි නොවන අයුරින් වෙළෙඳපොළ මිල නියම කිරීමේ බලයක් ඇත.

- මිල සකසන්නෙකු මුහුණ දෙන වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බසී.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 02කට ලකුණු 02යි)

www.SamithAlwis.wordpress.com

මිල ගනුවා:

- වෙළෙඳපොළ මිල කෙරෙහි කිසිඳු බලපෑමක් කළ නොහැකි, පවතින මිලට තමන් කැමති ප්‍රමාණයක් අලෙවි කරගත හැකි නිෂ්පාදන ආයතනයක් මිල ගනුවෙකු ලෙස සැලකේ. නිෂ්පාදකයාට වෙළෙඳපොළ මිල වෙනස් කළ නොහැකි අතර, වෙළෙඳපොළ මිලට අනුව නිෂ්පාදකයාට හැඩ ගැසීමට සිදු වේ.

- පූර්ණ තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක් සමස්ත වෙළෙඳපොළ තුළ ඉතා නොවැදගත් සැපයුම්කරුවෙකු වන බැවින්, වෙළෙඳපොළ මිල කෙරෙහි බලපෑමක් කිරීමට අසමත් වන අතර, පවත්නා මිල භාර ගැනීමට එම ආයතනයට සිදු වේ.

- එබඳු නිෂ්පාදන ආයතනයක් මුහුන දෙන ඉල්ලුම් වක්‍රය අපරිමිත නම්‍ය හෙවත් ප්‍රමාණ අක්ෂයට සමාන්තර රේඛාවක් වේ.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 02කට ලකුණු 02යි)**


(v) කතිපයාධිකාරය හා ඒකාධිකාරී තරගය අතර වෙනස්කම්:

| කතිපයාධිකාරය | ඒකාධිකාරී තරගය |
|---|---|
| - ඉතා විශාල ආයතන අතළොස්සක් වෙළෙඳපොළ ආධිපත්‍ය උසුලයි. | - කුඩා ආයතන විශාල සංඛ්‍යාවක් වෙළෙඳපොළ තුළ සිටී. |
| - නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය සමජාතීය හෝ ප්‍රභේදනය වූ හෝ එකක් විය හැකිය. | - නිෂ්පාදනය කරන ලබන භාණ්ඩය අවශ්‍යයෙන්ම ප්‍රභේදනය වූවකි. |
| - නිෂ්පාදන ආයතන අතර ඉතා දැඩි අන්‍යෝන්‍යය රැඳියාවක් පවතී. | - අන්‍යෝන්‍ය රැඳියාවක් නොපවතී. |
| - කර්මාන්තය තුළට ප්‍රවේශය වීමට දැඩි බාධක පවතී. | - අබාධ ප්‍රවේශය පවතී. |
| - කතිපයාධිකාරී ආයතන අතර විධිමත් හෝ නොවිධිමත් අයුරින් එකතු වීම් (collusion) ඇති කොට ගෙන සාමුහිකව මිල ප්‍රතිපත්ති තීරණය කිරීමේ ප්‍රවණතාවක් පවතී. | - ආයතන ස්වාධීනව කටයුතු කිරීමට නැඹුරු වේ. |


**(එක් වෙනසකට ලකුණු 02 බැගින් ඕනෑම වෙනස්කම් 03කට ලකුණු 06යි)**

www.SamithAlwis.wordpress.com

**03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අයදුම්කරුවන්ගෙන් 58%ක් 03 වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අතර, මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 5ක් ඇති අතර අනු කොටස් පහේම පහසුතාව 40%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (i) වී ඇති අතර, එහි පහසුතාව 40%කි. පහසුතාව වැඩිම අනුකොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 59%කි.

- i අනු කොටස සඳහා පහසුතාව 40%කි. මෙම අනු කොටස මගින් අපේක්ෂා කරන්නේ කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය නිර්වචනය කිරීමයි. මෙම ගැටලුවෙහි දුෂ්කරතාව කෙරෙහි බලපා ඇත්තේ නිෂ්පාදන න්‍යායේදී ‘කෙටි කාලය’ නිවැරදිව අර්ථ දැක්වීමේ නොහැකියාවයි. ප්‍රායෝගික උදාහරණ යොදා ගනිමින් කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය අර්ථ දැක්වීමේ නිපුණතාව ඇති කළ යුතුය.

- ii අනු කොටස සඳහා පහසුතාව 48%කි. මෙම ගැටලුවෙහි දුෂ්කරතාව කෙරෙහි බලපා ඇත්තේ හීනවන ඵලදා න්‍යාය නිවැරදිව අර්ථ කථනය කිරීමට නොහැකි වීම සහ හීනවන ඵලදාව සහ නිෂ්පාදන පිරිවැය වක්‍රවල හැසිරීම අතර සම්බන්ධය පිළිබඳව අවබෝධය නොමැති කමයි. සංඛ්‍යාත්මක හා ප්‍රස්තාරික නිදසුන් යොදා ගනිමින් ඵලදායිතාව සහ පිරිවැය වෙනස් වීම අතර සම්බන්ධය පැහැදිලි කළ යුතුය.

- iii අනු කොටසේ පහසුතාව 59%කි. මෙම ගැටලුව මගින් ගණකාධිකරණ පිරිවැය සහ ආර්ථික පිරිවැය අතර වෙනස සැසඳීමක් අපේක්ෂා කෙරේ. ප්‍රශ්නයේ දුෂ්කරතාව කෙරෙහි පිරිවැය සංකල්ප හා එහි අන්තර්ගතය පිළිබඳව අවබෝධය මඳ බව හා පිළිතුර ඉදිරිපත් කිරීමේදී සංකල්ප අතර වෙනස අවධාරණය වන පරිදි සැසඳීමක් කිරීමට අසමත් වීම හේතු වී ඇත. නිදසුන් යොදා ගනිමින් පිරිවැය සංකල්ප අතර වෙනස අවධාරණය කළ යුතු වේ.

- iv අනු කොටසෙහි දැක්වෙන ගැටලුවෙන් වෙළෙඳපොළ ව්‍යුහ පිළිබඳ දැනුම ඇසුරින් මිල සකසන්නා සහ මිල ගනුවා යන සංකල්ප පිළිබඳ අවබෝධය පරීක්ෂා කෙරේ. මෙහි දුෂ්කරතාව 42%ක් වී ඇත්තේ ඒ ඒ වෙළෙඳපොළ ව්‍යුහයන් තුළ ආයතනයකට මිල තීරණය කිරීමේ හැකියාව හෝ නොහැකියාව පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම නිසයි.

  පූර්ණ තරග ආයතනයකට වෙළෙඳපොළේ තීරණය වූ මිල කෙරෙහි බලපෑම් කළ නොහැකි වීම සහ ඊට හේතු ද පූර්ණ තරග නොවන අනෙකුත් වෙළෙඳපොළ ව්‍යුහයන් තුළ කටයුතු කරන ආයතනයන්ට මිල තීරණය කිරීමේ හැකියාව සහ ඊට හේතු ද ඒ අනුව ආයතන විසින් මුහුණ දෙන ඉල්ලුම්වක්‍ර වල ස්වභාවය ද පැහැදිලි කළ යුතුය.

- v අනු කොටසේ පහසුතාව 57%කි. මෙම අනු කොටසෙහි දුෂ්කරතාවයට හේතු වී ඇත්තේ විවිධ නිර්ණායක ඔස්සේ වෙළෙඳපොළ ව්‍යුහ සැසඳීම පිළිබඳව ශිෂ්‍යයන් තුළ පවත්නා දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නොවීමයි. එබැවින් ප්‍රධාන වෙළෙඳපොළ ආකෘති හතර තුළනාත්මකව සැසඳීම මගින් සුවිශේෂි ගුණාංග අනාවරණය කිරීමට ශිෂ්‍යයා තුළ නිපුණතා වර්ධනය කළ යුතුය.

www.SamithAlwis.wordpress.com

## 04 ප්‍රශ්නය

4. (i) කුටුම්බ සහ ආයතන අතර භාණ්ඩ, සේවා සහ නිෂ්පාදන සාධක, ගලා යන ආකාරය දක්වෙන චක්‍රීය ප්‍රවාහ සටහනක් අඳින්න. මූල්‍ය ප්‍රවාහයන් ද එම සටහනෙහි දක්වන්න. එක් එක් ප්‍රවාහය යොමු වන දිශාව ද පෙන්නුම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ආර්ථිකයක මුළු නිමැවුම අවශ්‍යයෙන් ම එහි මුළු ආදායමට සමාන වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

(iii) ඇතැම් ඵලදායී ආර්ථික කටයුතු මිනුම් නො කරන්නේත්, එබැවින් ම ඒවා දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නො කරන්නේත් ඇයි? රටක මුළු නිමැවුම ඇස්තමේන්තු කිරීමේ දී මෙය බරපතල ප්‍රශ්නයක් නොවේ ද? පිළිතුර පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iv) පහත සඳහන් ද අතුරෙන් මෙම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය තුළට ඇතුළත් කෙරෙනුයේ කවරක් ද? ඔබේ පිළිතුර එක් එක් කරුණක් සම්බන්ධයෙන් පැහැදිලි කරන්න.

(අ) සමාගමක් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා ලැබුණු පොලිය

(ආ) විශ්‍රාමික රාජ්‍ය සේවකයකුට ලැබුණු විශ්‍රාම වැටුප

(ඇ) රක්ෂණ ඔප්පුවක් මිල දී ගැනීම

(ඈ) මූල්‍ය සමාගමක කොටස් 100 ක් මිල දී ගැනීම

(ඉ) නිවසක් කුලියට දීමෙන් උපයා ගත් බදු කුලිය *(ලකුණු 05 යි)*

(v) එක්තරා කල්පිත ආර්ථිකයක් සඳහා දී ඇති පහත සඳහන් දත්ත සැලකිල්ලට ගන්න. (සංඛ්‍යා රුපියල් බිලියනවලිනි.)


| **අයිතමය** | **වටිනාකම** | **අයිතමය** | **වටිනාකම** |
|---|---|---|---|
| වැටුප්, වේතන සහ අතිකුත් ශ්‍රමික ආදායම් | 225 | ශුද්ධ අපනයන | 11 |
| වක්‍ර බදු | 25 | ක්ෂයවීම් | 40 |
| පොලී ආදායම් | 55 | සහනාධාර | 20 |
| නො බෙදූ සමාගමික ලාභ | 72 | සමාගමික ආදායම් බදු | 18 |
| දේපොල ආදායම් | 34 | ලාභාංශ | 16 |
| ස්වයං රැකියා නියුක්තිකයන්ගේ ආදායම් | 80 | විදේශ ශුද්ධ සාධක ආදායම් | 5 |


ඉහත සඳහන් දත්ත උපයෝගී කර ගනිමින් වෙළඳපොළ මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය ගණනය කරන්න. *(ලකුණු 05 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(4) (i) සරල වෘත්ත ප්‍රවාහ සටහනක් ඉදිරිපත් කළ හැකි ආකාර කිහිපයකි.

www.SamithAlwis.wordpress.com




- මූර්ත ප්‍රවාහ දිශාවන් සමඟ නිවැරදිව දැක්වීම. (ලකුණු 02යි)
- මූල්‍ය ප්‍රවාහ දිශාවන් සමඟ නිවැරදිව දැක්වීම. (ලකුණු 02යි)

(ii) - නිෂ්පාදනය කිරීම සහ ආදායම් ජනනය කිරීම එකම ක්‍රියාවලියක පැතිකඩ දෙකකි. නිෂ්පාදනය නිසා ආදායම් බිහි වේ. නිෂ්පාදනය සඳහා යොදා ගත් සාධක සඳහා කරන ලද ගෙවීම්වල මුළු අගය (සාධක ආදායම්) නිෂ්පාදනයේ අගයට සමාන වේ. එබැවින් නිමැවුමේ වටිනාකම, ආදායමේ වටිනාකමට සමාන වේ. දෙන ලද වර්ෂයක් තුළ සාධක පිරිවැය යටතේ ගණනය කරන ලද මුළු නිෂ්පාදනයේ වටිනාකම, එම කාලය තුළ නිෂ්පාදනයට දායක වූ නිෂ්පාදන සාධක විසින් උපයන ලද මුළු ආදායමට අනිවාර්යයෙන්ම සමාන වේ.

(ලකුණු 02යි)

(iii) - සංවිධානාත්මක වෙළෙඳපොළකින් බැහැරව සිදුවන ඵලදායී ගනුදෙනු දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී සැලකිල්ලට නොගැනේ. උදාහරණ වශයෙන් කුටුම්බය තුළ තමන් විසින්ම ඉටු කරනු ලබන සේවාවන්ගේ වටිනාකම ඉන් ප්‍රධාන තැනක් ගනී. නිවසේ පිරිසිදු කිරීම්, ආහාර පිසීම්, ළමයින් රැක බලා ගැනීම් ආදිය දැක්විය හැකිය.

එසේම තමන්ගේ පරිභෝජනය සඳහා කුටුම්බය තුළම නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ (උදා:- ගෙවතු බෝග) වෙළෙඳපොළ ගනුදෙනුවකට පාත්‍ර නොවන බැවින් දළ දේශීය නිෂ්පාදිතය තුළට ප්‍රවේශ නොවේ.

(ලකුණු 01යි)

- බලධාරීන් වෙත වාර්තා නොවන බැවින්, සැඟවුණු ආර්ථිකයේ සිදුවන ඵලදායී ආර්ථික කටයුතු ද දළ දේශීය නිෂ්පාදිතය තුළට ඇතුළත් නොවේ. සැඟවුණු ආර්ථිකයේ සිදුවන ඵලදායි ආර්ථික ක්‍රියා දෙයාකාරයකි. බදුවලින් සහ නියාමන ක්‍රියාවලියෙන් වැළැකී සිටීම සඳහා ඇතැම් නීත්‍යානුකූල ඵලදායී ආර්ථික ක්‍රියා වාර්තා නොකෙරේ. එසේම නීති විරෝධී ඵලදායී ආර්ථික ක්‍රියාවන් ද බලධාරීන් වෙත වාර්තා නොවේ.

(ලකුණු 02යි)

- යම් වර්ෂයක් තුළ සිදුවන ඵලදායී ආර්ථික ක්‍රියාවල වටිනාකම මිනුම් කිරීම දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමෙන් අපේක්ෂා කරන බැවින්, දළ දේශීය නිෂ්පාදිතය තුළට ඉහත සඳහන් කළ ආර්ථික කටයුතු ප්‍රවේශ නොවීම, එම මිනුමේ බරපතල අඩුපාඩුවකි. මෙහි බරපතලකම සැබෑ වශයෙන් රඳා පවතිනුයේ එවැනි ආර්ථික කටයුතු ආර්ථිකය තුළ සාපේක්ෂ වශයෙන් කොතෙක් දුරට වැදගත් වේද යන්න මතය. ඇතැම් රටවල මෙම සැඟවුණු ආර්ථිකයේ විශාලත්වය, දළ දේශීය නිෂ්දිතයෙන් 30% පමණ වෙතියි ඇස්තමේන්තු කර ඇත.

(ලකුණු 01යි)

(iv) (අ) ඇතුළත් වේ. ඵලදායි ගනුදෙනුවකි. පිළිණපත් හිමියන් ලබන පොළී ආදායම ප්‍රාග්ධනය ණයට ලබා දීමේ සේවාව සඳහා ලැබෙන ගෙවීමකි.

(ආ) ඇතුළත් නොවේ. සංක්‍රාම ගෙවීමකි.

(ඇ) ඇතුළත් වේ. ඵලදායී ගනුදෙනුවකි. රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීම යනු අවසාන සේවාවක් මිලදී ගැනීමක් වේ.

(ඈ) ඇතුළත් නොවේ. මූල්‍ය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනුවකි. මෙහිදී සිදුවනුයේ මූල්‍ය පත්‍රිකාවල අයිතිය හුවමාරු වීමක් පමණි.

(ඉ) ඇතුළත් වේ. ඵලදායි ගනුදෙනුවකි. අවසාන සේවාවක් මිලදී ගැනීමකි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි)

(v) වෙළෙඳපොල මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතයේ වටිනාකම:

= වැටුප් ආදායම් + පොළී ආදායම් + සමාගමික ලාභ + දේපොළ ආදායම් + ස්වයං රැකියා ආදායම් + විදේශ ශුද්ධ සාධක ආදායම් + ක්ෂයවීම් + ශුද්ධ වක්‍ර බදු


(ලකුණු 03යි)

= 225 + 55 + (72 + 18 + 16) + 34 + 80 + 5 + 40 + (25 - 20) (ලකුණු 01යි)

= රු. බිලියන 550 (ලකුණු 01යි)

www.SamithAlwis.wordpress.com


**04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**




04 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 29%ක් පිළිතුරු සපයා ඇති අතර, මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ට වඩා ලබාගත් පිරිස 38%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 62% ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ 10 ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 9ක් ඇති අතර ඉන් අනු කොටස් 08ක් සඳහාම පහසුතාව 40%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (v) වී ඇති අතර, එහි පහසුතාවය 33%කි. පහසුතාව වැඩිම අනුකොටස iv(අ) වී ඇති අතර, එහි පහසුතාව 78%කි.

★ i අනු කොටස සඳහා පහසුතාව 59%කි. කුටුම්බ සහ නිෂ්පාදන ආයතන අතර භාණ්ඩ හා සේවා, නිෂ්පාදන සාධක සහ ඊට අදාළ මූල්‍ය ප්‍රවාහ ඇසුරින් අන්තර් සම්බන්ධතාවය ගොඩ නැගෙන ආකාරය සරල රූප සටහනකින් දැක්වීමේ හැකියාව මැන බැලීමට යොමු වූ ප්‍රශ්නයකි. මූර්ත හා මූල්‍ය ප්‍රවාහ නිවැරදිව නම් කිරීමට හා දිශාව දැක්වීමට, සැලකිලිමත් නොවීම දුෂ්කරතාවයට හේතු විය. විශේෂයෙන් සාධක වෙළෙඳපොළ හා භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ යොදාගනිමින් කුටුම්බ සහ ආයතන අතර අන්තර් සම්බන්ධතාවය ගොඩ නැගෙන ආකාරය රූප සටහන් මගින් අවධාරණය කිරීම වැදගත්ය.

★ ii අනු කොටස සඳහා පහසුතාව 45%කි. රටක මුළු නිමැවුම සහ මුළු ආදායම එකිනෙකට සමාන වීමට හේතු විමසීම සඳහා යොමු වූ ගැටලුවකි. නිෂ්පාදනය කිරීම සහ ආදායම් ජනනය වීම එකම ක්‍රියාවලියක පැතිකඩ දෙකක් බව අවබෝධ කරගෙන නොතිබුණි. නිෂ්පාදනය බිහිවන්නේ නිෂ්පාදන සාධක යෙදවුම් ලෙස භාවිත කිරීමෙන් බවත් එමගින් නිෂ්පාදන සාධක හිමියන්ට සාධක ආදායමක් හිමිවන බවත් යම් වර්ෂයකදී සාධක පිරිවැය යටතේ ගණනය කරන ලද මුළු නිෂ්පාදිතයේ වටිනාකම එම කාලය තුළ නිෂ්පාදන සාධක හිමියන් විසින් උපයා ගන්නා ලද ආදායමට සමාන විය යුතු බවත් අවබෝධ විය යුතුය. මෙය ජාතික ගිණුම්කරණයේ මූලික පදනම බව අවධාරණය වන ආකාරයට සිසුන් දැනුවත් කළ යුතුය.

www.SaminAlwis.wordpress.com

- iii අනු කොටසේ පහසුතාව 41%කි. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතැම් ඵලදායී ආර්ථික කටයුතු ඇතුළත් නොකිරීමත්, ඊට හේතු සහ එය මුළු නිමැවුම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රබල ගැටලුවක් වන්නේ මන්ද යන්න පිළිබඳ අවබෝධය පරීක්ෂාවට යොමු වූ ගැටලුවකි. එසේ ඇතුළත් නොකෙරෙන ඵලදායි ආර්ථික කටයුතු සහ ඊට හේතු නිවැරදිව අවබෝධ කර ගෙන නොතිබුණි. එම ආර්ථික කටයුතු නිමැවුමේ වටිනාකමින් බැහැරවීම මගින් ඇති කරන බලපෑමේ ප්‍රමාණය විවිධ රටවල එම කටයුතුවල සාපේක්ෂ වැදගත්කම මත තීරණය වන බව අවබෝධ කර ගත යුතුය.

- දෙන ලද ආර්ථික කටයුතු කිහිපයක් අතරින් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතුළත් කෙරෙන ඈ කවරේද? යන්න පැහැදිලි කිරීමේ හැකියාව මැනීම සඳහා යොමු වූ ගැටලුවකි. අ, ආ, ඇ, ඈ සහ ඉ වශයෙන් උප කොටස් 05ක ප්‍රශ්නයකි.

  ‘අ’ අනු කොටසේ පහසුතාව 78%කි. එහෙත් හේතු පැහැදිලි කිරීමේදී බැඳුම්කර (පිළිණ පත්) මිලට ගැනීම ප්‍රාග්ධනය ණයට දීමක් බවත් ඊට ලැබෙන ආදායමක් බැවින් ඵලදායි ගනුදෙනුවක් බවත් නිවැරදිව දැක්වීමට සිසුන් අපොහොසත් වී තිබුණි.

  ‘ආ’ අනු කොටසේ පහසුතාව 73%කි. රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් සංක්‍රාම ගෙවීමක් බව හැඳින්වීමට 27% පමණ දුෂ්කරවීම අවධානයට යොමු කළ යුතුය.

  ‘ඇ’ අනු කොටසේ පහසුතාව 51%කි. රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීම ඵලදායී අවසාන සේවාවක් මිලදී ගැනීමක් බව තීරණය කිරීමට සිසුන්ට නොහැකි වී තිබුණි.

  ‘ඈ’ අනු කොටසේ පහසුතාව 48%කි. සමාගම් කොටස් මිලට ගැනීම මූල්‍ය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනුවක් බව තහවුරු කර ගෙන නොතිබීම ඉහළ දුෂ්කරතාවයට හේතු විය.

  ‘ඉ’ අනු කොටසේ පහසුතාව 62%කි. නිවසක් කුලියට දීමෙන් උපය ගනු ලබන බදු කුලී ආදායම සාධක ආදායමක් බව තහවුරු කිරීමට හැකි විය යුතුය.

  පොදුවේ ගත්විට ජාතික ගිණුම්තුළ ඇතුළත්විය යුතු ඵලදායී ආර්ථික ක්‍රියා ඉන් බැහැර කළ යුතු ආර්ථික ක්‍රියා පිළිබඳ නිවැරදි අවබෝධයක් සිසුනට ලබා දීම ඉතා වැදගත් වේ.

- v අනු කොටසේ පහසුතාව 33%කි. විවිධ ප්‍රවේශයන් ඔස්සේ දළ දේශීය හෝ දළ ජාතික නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කිරීමේදී ඇතුළත් විය යුතු සංරචක නිවැරදිව අවබෝධ කර ගැනීමට නොහැකියාව සහ සාධක මිල සහ වෙළෙඳපොළ මිල අතර වෙනසක් පැවතීමට හේතු හඳුනා ගැනීමට අපොහොසත් වීම 67%ක පමණ දුෂ්කරතාවයන්ට හේතු වී ඇත. සංකල්ප අතර වෙනස දැක්වෙන අයුරින් සංඛ්‍යාත්මක අභ්‍යාස මගින් ගණනය කිරීම සඳහා අවධානය යොමු විය යුතුය.

www.SamithAlwis.wordpress.com

## 05 ප්‍රශ්නය

5. (i) සමතුලිත ජාතික ආදයම් මට්ටම යන්නෙන් කවරක් අදහස් වේ දැයි පැහැදිලි කරන්න. ආදයම් මට්ටමේ සමතුලිතය හට ගැනීමට අවශ්‍ය කරන කොන්දේසි කවරේ ද? *(ලකුණු 06 යි)*

(ii) ඉතිරිකිරීම් 'කාන්දුවීමක්' (leakage) වශයෙන් සලකනු ලබන්නේ ඇයි? *(ලකුණු 02 යි)*

(iii) බදු අය කිරීමක් නොමැති එක්තරා ආර්ථිකයක, පරිභෝජන වියදම් ලේඛනය පහත දක් වේ. (සියලුම දත්ත රුපියල් බිලියනවලිනි.)

| දළ දේශීය නිෂ්පාදිතය (Y) | පරිභෝජනය (C) | දළ දේශීය නිෂ්පාදිතය (Y) | පරිභෝජනය (C) |
|---|---|---|---|
| 100 | 120 | 400 | 360 |
| 200 | 200 | 500 | 440 |
| 300 | 280 | 600 | 520 |

මෙම පරිභෝජන ලේඛනය ප්‍රස්තාරයකට නගන්න. එම දත්ත ඇසුරෙන් පරිභෝජන ශ්‍රිතයට අදළ සමීකරණය ව්‍යුත්පන්න කරන්න. *(ලකුණු 06 යි)*

(iv) දැන්, රජය ස්ථාවර බදු ක්‍රමයක් හඳුන්වා දී දළ දේශීය නිෂ්පාදිතයේ සෑම මට්ටමක දී ම රුපියල් බිලියන 20 ක් බදු වශයෙන් එකතු කර ගනු ලැබේ යයි සලකන්න. එහි ප්‍රතිඵල වශයෙන් ඇති වන අලුත් පරිභෝජන ලේඛනය ප්‍රස්තාර සටහනෙහි දක්වන්න. එයට අනුරූප සමීකරණය ද ව්‍යුත්පන්න කරන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(5) (i) - කිසියම් ජාතික ආදායම මට්ටමක් පවත්නා අගයේ සිට ඉහළට හෝ පහළට හෝ වෙනස් වීමට ප්‍රවණතාවක් නොදක්වන්නේ නම්, එම ජාතික ආදායම් මට්ටම සමතුලිත ආදායම් මට්ටමක් ලෙස සැලකේ.

(ලකුණු 02යි)

- සමාහාර වියදම සමාහාර නිමැවුමේ අගයට සමාන වීම. Y = E

(ලකුණු 02යි)

- සමාහාර වියදම් ප්‍රවාහයෙන් සිදුවන කාන්දුවීම් හෙවත් ගිලිහීම්, සමාහාර වියදම් ප්‍රවාහයට ඇතුළුවනදැට (විදීම්වලට) සමාන වීම. W = J


(ලකුණු 02යි)

(ii) - කාන්දුවීමක් ලෙස සලකනු ලබන්නේ කුටුම්බ හා ව්‍යාපාර ආයතන වෙත ගෙවීම් ස්වරූපයෙන් තමන් වෙත ලැබෙන ලැබීම් ප්‍රවාහයෙන්, නැවතත් ආපසු වියදම් ප්‍රවාහයට එකතු නොවන ප්‍රවාහයන්ය. කුටුම්බ ඉතුරුම් ද තමන්ට ලැබෙන ආදායමෙන් පරිභෝජන වියදමක් වශයෙන් නැවතත් වියදම් ප්‍රවාහයට එකතු නොවන ප්‍රවාහයකි. ඉතුරුම් යනු වැය කළ හැකි ආදායමෙන් පරිභෝජනය සඳහා වැය නොකෙරෙන ප්‍රමාණයයි. එබැවින් ඉතුරුම් චක්‍රීය ආදායම් ප්‍රවාහයෙන් ගිලිහියාමක් හෙවත් කාන්දු වීමක් ලෙස සලකනු ලැබේ.

(ලකුණු 02යි)

www.SamithAlwis.wordpress.com

(iii) පරිභෝජන ලේඛනය ප්‍රස්තාර සටහනක් මගින් දැක්වීම:




-(බද්දට පෙර පරිභෝජන ශ්‍රිතය නිවැරදිව දැක්වෙන ප්‍රස්තාර සටහනට ලකුණු 03යි)

-(බද්දට පසු පරිභෝජන ශ්‍රිතය නිවැරදිව දැක්වෙන ප්‍රස්තාර සටහනට ලකුණු 03යි)

www.SamithAlwis.wordpress.com

- බද්දට පෙර පරිභෝජන ශ්‍රිතයට අදාල සමීකරණය:

$C = a + bY$

$a = 40$ (ලකුණු 01යි)

$b = \frac{\Delta C}{\Delta Y} = \frac{80}{100} = 0.8$ (ලකුණු 01යි)

$C = 40 + 0.8Y$ (ලකුණු 01යි)


(iv) - බද්දට පසු පරිභෝජන ශ්‍රිතයට අදාල සමීකරණය:

$C = a + b(Y - T)$ (ලකුණු 01යි)

$C = 40 + 0.8(Y - 20)$ (ලකුණු 01යි)


$C = 24 + 0.8Y$ (ලකුණු 01යි)

### 05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලින් අඩුම පිරිසක් තෝරා ඇති ප්‍රශ්නය 05 වන ප්‍රශ්නයයි. එම ප්‍රතිශතය 18%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 20%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 4ක් ඇති අතර (iii) අනු කොටස පහසුම ප්‍රශ්නය වී ඇත. එහි පහසුතාව 59%කි. පහසුතාව අඩුම අනු කොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 38%කි.

- i අනු කොටස සඳහා පහසුතාව 58%කි. සමතුලිතය පිළිබඳ සංකල්පය නිවැරදිව අර්ථ දැක්වීමට අපොහොසත් වීමත්, Y=E සහ W=J යන කොන්දේසි එක විට ඉටු වන කොන්දේසි බව හඳුනාගෙන ඉදිරිපත් නොකිරීමෙන් අයදුම්කරුවන්ගෙන් 55% ක්ම ලකුණු 10 හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත. තව ද සමතුලිත ජාතික ආදායම් මට්ටම නිර්වචනය කළ යුත්තේ සමතුලිතතා සංකල්පය පදනම් කොටගෙන මිස, කොන්දේසි මත නොවන බවත්, ශිෂ්‍යයා තේරුම් ගත යුතුය. සමතුලිත ජාතික ආදායම් මට්ටම නිවැරදිව අර්ථ දැක්වීමටත්, එය තීරණය වීම සඳහා අවශ්‍ය කොන්දේසි ඉදිරිපත් කිරීමටත් නිපුණතා වර්ධනය කර ගත යුතුය.

- ඉතුරුම් නැවත වියදම් ප්‍රවාහයට එකතු නොවන බව ප්‍රකාශ කිරීමට අසමත් වීමෙන් (ii) අනු කොටසේ පහසුතාව 40% ක අඩු මට්ටමකට පැමිණ ඇත. ඉතුරුම් වියදම් ප්‍රවාහයෙන් පිටතට ගලා යන ආකාරය දැක්වෙන රූප සටහන් සංඛ්‍යාත්මකව අගයන් සහිතව භාවිත කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

- iii අනු කොටස සඳහා පහසුතාව 59%කි. දළ දේශීය නිෂ්පාදිතය හා පරිභෝජනයට අදාළ දත්ත ඇසුරින් පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කිරීමට යොමු වූ ගැටලුවකි. ගණනය කිරීම් ඔස්සේ ශ්‍රිතයට අවශ්‍ය දත්ත ලබා ගැනීමට සැලකිය යුතු සිසුන් පිරිසක් අසමත් වී ඇත. ආන්තික පරිභෝජන නැඹියාව ගණනය කිරීමට සහ ස්වායත්ත පරිභෝජනය ගණනය කිරීමේ නිපුණතා වර්ධනය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කොට, දී ඇති දත්ත ඇසුරින් ප්‍රස්තාර නිවැරදිව නිර්මාණය කිරීමට හුරු කිරීම වැදගත් වේ.

- iv අනු කොටසේ පහසුතාව 38%කි. භාණ්ඩයක් මත බදු පැනවීමත්, රජය ආර්ථිකයක් මත ස්ථාවර බදු පැනවීමත් නිසා ඇතිවන ප්‍රතිවිපාක වෙන් කොට හඳුනා ගැනීමට අසමත් වී ඇත. රජය ස්ථාවර බදු පැනවීම නිසා වැය කළ හැකි ආදායමට ඉන් ඇතිවන බලපෑමත් එහි ප්‍රතිවිපාකයක් ලෙස සමාහාර වියදම වෙනස් වන ආකාරයත් පැහැදිලි වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

www.SumithAlwis.wordpress.com

## 06 ප්‍රශ්නය

**"ආ" උප කොටස**
**(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

6. (i) මිනිසුන් මුදල් ඉල්ලුම් කිරීමට යොමු කෙරෙන ප්‍රධාන හේතු කවරේ ද? *(ලකුණු 03 යි)*

(ii) 'ආසන්න මුදල්' යනු කවරක් ද? $M_4$ මූල්‍ය සමාහාරය තුළ ඇතුළත් ආසන්න මුදල් සංරචක කවරේ ද? *(ලකුණු 05 යි)*

(iii) බැංකු පද්ධතිය තුළ එක්තරා වාණිජ බැංකුවක් සතුව, රුපියල් බිලියන 200 ක සල්ලි සංචිතයක් ද, රුපියල් බිලියන 800 ක ණය ද, රුපියල් බිලියන 1 000 ක තැන්පතු ද පවතී.

(අ) මෙම තොරතුරු ඇතුළත් බැංකුවේ ශේෂ පත්‍රය සකසන්න. *(ලකුණු 02 යි)*

(ආ) බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන සංචිත අවශ්‍යතාව 12% ක් වේ නම්, එම බැංකුවට ලබා දිය හැකි විශාලතම ණය මුදලේ ප්‍රමාණය කොපමණ ද? *(ලකුණු 02 යි)*

(iv) මුදල් සැපයුමේ හට ගන්නා සැබෑ ප්‍රසාරණය, බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකයෙන් දක්වෙන ප්‍රමාණයට වඩා වෙනස් වීමට බලපාන සාධක කවරේ ද? *(ලකුණු 04 යි)*

(v) මුදල් සැපයුමේ සංකෝචනයක් ඇති කිරීම සඳහා මහ බැංකුව විසින් විවට වෙළෙඳපොළ කටයුතු යොදා ගනු ලබන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(6) (i)
- ගනුදෙනු චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ චේතනාව

(එක් කරුණකට ලකුණු 01ක බැගින් ලකුණු 03යි)

(ii) - විනිමය මාධ්‍යයක කාර්යය ඉටු නොකරනු ලබන නමුදු, ඉතා පහසුවෙන් විනිමය මාධ්‍යයක් බවට පෙරළා ගත හැකි, වටිනාකම් මාධ්‍යයක් වශයෙන් සාර්ථකව කටයුතු කරන මූල්‍ය වත්කම් ආසන්න මුදල් ලෙස සැලකේ. (ලකුණු 02යි)

$M_4$ මූල්‍ය සමාහාරය තුළ ඇතුළත් ආසන්න මුදල් සංරචක

- මහජනයා සතු වාණිජ බැංකු වෙතැති කාලීන හා ඉතුරුම් තැන්පතු
- අනේවාසික ව්‍යවහාර මුදල් (NRFC) තැන්පතුවලින් 50%ක්
- එතෙර බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු තැන්පතු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති මහජනයා සතු තැන්පතු
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙතැති මහජනයා සතු තැන්පතු

(ලකුණු 03යි)

(සංරචක සියල්ලම සඳහන් කොට නැත්නම් ලකුණු හිමි නොවේ)

(iii) (අ) බැංකුවේ ශේෂ පත්‍රය

(රු. බිලියන)

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| තැන්පතු | 1,000 | සංචිත | 200 |
| | | ණය | 800 |
| එකතුව | 1,000 | එකතුව | 1,000 |

(ලකුණු 02යි)

(ආ) - සැබෑ සංචිත ප්‍රමාණය = රු. බිලියන 200
- අවශ්‍ය සංචිත ප්‍රමාණය = $1000 \times 12\%$ = රු. බිලියන 120
- අධි සංචිත ප්‍රමාණය = $200 - 120$ = රු. බිලියන 80 (ලකුණු 01යි)

- ඒ අනුව ලබා දිය හැකි විශාලතම ණය මුදල = අධි සංචිතයේ ප්‍රමාණය
= රු. බිලියන 80

(ලකුණු 01යි)

www.SamithAlwis.wordpress.com

(iv) - බැංකු පද්ධතියේ සිට බැංකු නොවන මූල්‍ය ආයතන කරා ව්‍යවහාර මුදල් කාන්දු වී යාම.
- ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමට මහජනයා දක්වන අභිරුචිය වැඩි වීම.
- බැංකු විසින් අධි සංචිත තබා ගැනීමට කැමැත්තක් දැක්වීම.
- බැංකු ණය සඳහා ඉල්ලුමක් ඇති නොවීම.


**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ලකුණු 04යි)**

(v) - මුදල් සැපයුම සංකෝචනය කිරීම සඳහා මහ බැංකුව විසින් විවට වෙළෙඳපොළ කටයුත්තක් වශයෙන් සුරැකුම්පත් අලෙවි කළ යුතුය. එමගින් බැංකු පද්ධතිය තුළ ඇති ද්‍රවශීලතාව ඉවත් කළ හැකි වේ. **(ලකුණු 02යි)**

- මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට සුරැකුම්පත් අලෙවි කරන විට, වාණිජ බැංකු සතු සංචිත මුදල් (අධි බලැති මුදල්) අඩු වේ. වාණිජ බැංකුවල ණය දීමේ ශක්තිය මේ නිසා අඩු වේ.


**(ලකුණු 02යි)**

**06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




06 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 73%ක් පිළිතුරු සපයා ඇති අතර, මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 35%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.

www.SamithAlwis.wordpress.com




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 6ක් ඇති අතර අනු කොටස් 04ක පහසුතාව 45%ට වඩා වැඩිය. පහසුම අනු කොටස iii (අ) වී ඇති අතර, එහි පහසුතාව 90%කි. පහසුතාව අඩුම අනුකොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 30%කි.

- i අනු කොටස මගින් පරීක්ෂාවට ලක් කර ඇත්තේ මිනිසුන් මුදල් ඉල්ලුම් කිරීමට හේතු කවරේ ද යන්නයි. 79%ක් තරම් වූ පහසුතාව මගින් පෙන්නුම් කෙරෙන්නේ සිසුන් වැඩි දෙනෙකු නිවැරදි දැනුමකින් යුතු වුව ද සුළු පිරිසක් නිවැරදි දැනුමක් නොමැතිව සිටි බවයි. එබැවින් ජනතාව මුදල් ඉල්ලුම්කරන අරමුණු සහ ඒ කෙරෙහි බලපාන සාධක පිළිබඳ අවබෝධය පුළුල් වන ආකාරය ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම වැදගත්ය.

- ii අනු කොටස සඳහා වූ පහසුතාවය 31% කි. මෙම කොටසෙහි දුෂ්කරතාවය වැඩි වී ඇත්තේ ආසන්න මුදල් නිර්වචනය කිරීමට සිසුනට හැකියාව තිබුණ ද $M_4$ මූල්‍ය සමස්තය තුළ අන්තර්ගත ආසන්න මුදල් සංරචක හඳුනාගැනීමට නොහැකි වීමයි. එබැවින් $M_{2b}$ , $M_4$ යන මූල්‍ය සමාහාරයන් තුළ අන්තර්ගත ආසන්න මුදල් හඳුනාගැනීමේ නිපුණතා වර්ධනය කළ යුතුයි.

- iii අනු කොටසේ 'අ' උප කොටසේ පහසුතාව 90%ක් වැනි මට්ටමක පැවතීමෙන් පෙනී යන්නේ දී ඇති දත්ත ඇසුරෙන් වාණිජ බැංකුවක වගකීම සහ වත්කම් හඳුනා ගෙන ශේෂ පත්‍රය සකස් කිරීමට සිසුන්ට කුසලතාවයක් පවතින බවය.

  මෙම අනු කොටසේ 'ආ' උප කොටසේ දුෂ්කරතාවය 39%කි. ඊට හේතු වී ඇත්තේ වාණිජ බැංකුවක අධි සංචිත ප්‍රමාණය නිවැරදිව ගණනය කොට එමගින් තනි වාණිජ බැංකුවකට අලුතින් සැපයීමට හැකි ණය ප්‍රමාණය තීරණය කිරීමට සිසුන් තුළ පවතින අවබෝධය ප්‍රමාණවත් නොවීමය. ශේෂ පත්‍රයේ වත්කම් හා වගකීම් ඇසුරෙන් අධි සංචිත ගණනය කිරීමට හා තනි වාණිජ බැංකුවකට සහ බැංකු පද්ධතියකට සැපයීමට හැකි ණය ප්‍රමාණය පිළිබඳව සංඛ්‍යාත්මකව නිදසුන් මගින් නිපුණතා ප්‍රගුණ කළ යුතුය.

- iv 70%ක් වූ ඉහළම දුෂ්කරතාවයක් මෙම කොටසට හිමි වේ. මෙම දුෂ්කරතාවයට හේතු වී ඇත්තේ ගැටලුව මගින් විමසා ඇති තැන්පතු ප්‍රසාරණ සංගුණකය ඔස්සේ ප්‍රසාරණය කළ හැකි තැන්පතු ප්‍රමාණයත් සැබෑ වශයෙන් ප්‍රසාරණය කළ හැකි තැන්පතු ප්‍රමාණයක් අතර වෙනසට බලපාන හේතු සිසුන් විසින් නිශ්චිතව අවබෝධ කොට ගෙන නොතිබීමය. බැංකු පද්ධතියේ ශේෂ පත්‍රයක් නිදසුන් ලෙස ගෙන තැන්පතු ප්‍රසාරණය කිරීමේ විභවතාවය සහ සැබෑ වශයෙන් ප්‍රසාරණය කරන තැන්පතු ප්‍රමාණය, ඊටවඩා අඩුවීම කෙරෙහි විවිධ හේතු බලපාන ආකාරය අනාවරණය කළ යුතුයි.

- v අනු කොටසේ පහසුතාව 49%කි. මෙම කොටස මගින් පරීක්ෂා කරනු ලබන්නේ මුදල් සැපයුම සංකෝචනය කිරීම සඳහා විවට වෙළඳපොළ කටයුතු යොදාගන්නා ආකාරයයි. මෙම කොටසේ දුෂ්කරතාවය කෙරෙහි හේතු වී ඇත්තේ වාණිජ බැංකුවල ද්‍රවශීලතාවය අඩු කිරීම සඳහා සුරැකුම්පත් අලෙවි කළ යුතු බව හා එවිට වාණිජ බැංකු වල සංචිත අඩුවීම මගින් මුදල් සැපයුම අඩුවන ආකාරය පිළිබඳව දැනුම ප්‍රමාණවත් නොමැති වීමයි. මහ බැංකුවේ විවට වෙළෙඳපොළ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රසාරණය හා සංකෝචනය සඳහා භාවිත කරන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් සිසුන්ට ලබා දිය යුතුයි.

www.SamithAlwis.wordpress.com

## 07 ප්‍රශ්නය

7. (i) පහත දැක්වෙන භාණ්ඩ හා සේවාවන් නිර්වචනය කොට ඒවාට උදාහරණය බැගින් සපයන්න.
   (අ) ගෝලීය පොදු භාණ්ඩ
   (ආ) පොදු සම්පත්
   (ඇ) අර්ධ පොදු භාණ්ඩ *(ලකුණු 06 යි)*

   (ii) ව්‍යවස්ථාපිත බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය අතර වෙනස දක්වන්න. *(ලකුණු 04 යි)*

   (iii) බදු ක්‍රමයේ මධ්‍යස්ථභාවය (neutrality) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? *(ලකුණු 02 යි)*

   (iv) අයවැය ලේඛනයේ 'ප්‍රාථමික හිඟය' සහ 'ශුද්ධ මූල්‍ය හිඟය' යන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

   (v) ශ්‍රී ලංකා රජයේ **බදු නොවන** ප්‍රධාන අයභාර මූලාශ්‍ර සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(7) (i) (අ) - ගෝලීය ප්‍රජාවටම ප්‍රතිලාභ සැලසෙන ක්‍රියාකාරකම් ගෝලීය පොදු භාණ්ඩ ලෙස සැලකේ.

(ලකුණු 01යි)

- උදාහරණ: ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම වැළැක්වීම, ඕසෝන් ස්ථරය රැක ගැනීම, වසන්ගත රෝග මුළුමනින්ම ඉවත් කිරීම, දැනුම බිහි කිරීම, ලෝක අධිකරණය (World Court)

(ලකුණු 01යි)

(ආ) - පොදු සම්පත් යනු පරිභෝජනයේ තරගකාරිත්වයක් ඇති, එහෙත් පරිභෝජනය වළක්වාලිය නොහැකි ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සම්පත් වේ.

(ලකුණු 01යි)

- උදාහරණ: මත්ස්‍ය බිම්, පොදු තණ බිම්, පිරිසිදු වාතය, පිරිසිදු ජලය (ලකුණු 01යි)

(ඇ) - අර්ධ පොදු භාණ්ඩ යනු ධාරිතා මට්ටම කරා ළඟා වනතුරු පරිභෝජනයේ තරගකාරීත්වයක් දක්නට නොමැති, එහෙත් පරිභෝජනය වළක්වාලිය හැකි භාණ්ඩ වේ.

(ලකුණු 01යි)

- උදාහරණ: කෞතුකාගාර, කලාගාර, පොදු උද්‍යාන, මහා මාර්ග හා පාලම්, දර්ශනීය ස්ථාන

(ලකුණු 01යි)

(ii) - ව්‍යවස්ථාපිත බදු ආපාතය යනු නීත්‍යානුකූලව දරනු ලබන බදු බරය. (ලකුණු 01යි)

- ආර්ථික බදු ආපාතය යනු බද්දක් නිසා පෞද්ගලික මූර්ත ආදායමේ ඇතිවන වෙනස් වීම හෙවත් සැබෑ වශයෙන් දරනු ලබන බදු බරය.

(ලකුණු 01යි)

- ව්‍යවස්ථාපිත බදු ආපාතය ආර්ථික බදු ආපාතයෙන් වෙනස්වන ප්‍රමාණය රඳා පවතිනුයේ බදු බර විතැන් කිරීමේ හැකියාව මතය. බදු බර කිසිසේත් විතැන් කළ නොහැකි විට ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය අනන්‍ය වේ.

(ලකුණු 02යි)

www.samithAlwis.wordpress.com

(iii) - බදු ක්‍රමයේ මධ්‍යස්ථභාවය යන්නෙන් අදහස් වන්නේ බදු, ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපෑම් නොකරන බව හෙවත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති නොකරන බවය. එබැවින් මධ්‍යස්ථ බද්දක් අධි බදු බරක් ඇති නොකරයි.

**(ලකුණු 02යි)**

**[විකල්ප පිළිතුරු:**

කිසියම් බද්දක් කරන කොට කුටුම්බයක් හෝ නිෂ්පාදන ආයතනයක් විසින් භාණ්ඩ අතර කරන තේරීම්, යෙදවුම් අතර කරන තේරීම් සහ ස්ථානීය (locations) තේරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන්නේ නම් එය මධ්‍යස්ථ බද්දකි. **(ලකුණු 02යි)]**

(iv) - **ප්‍රාථමික හිඟය:** සමස්ත අයවැය හිඟයෙන් පොළී ගෙවීම් අඩු කළ විට ලැබෙන ශේෂය ප්‍රාථමික හිඟය වේ. **(ලකුණු 02යි)**

**[විකල්ප පිළිතුරු:**

දීමනා ඇතුළු රජයේ මුළු අයභාරයෙන් පොළී ගෙවීම් රහිත රජයේ මුළු වියදම (වර්තන හා ප්‍රාග්ධන) අඩු කළ විට ලැබෙන ශේෂය ප්‍රාථමික හිඟය වේ. **(ලකුණු 02යි)]**

- **ශුද්ධ මූල්‍ය හිඟය:** අයභාරය හා දීමනා ඇතුළත් රජයේ මුළු ලැබීම් ප්‍රමාණයත්, ණය වාරික ආපසු ගෙවීම්, නිදන් අරමුදලට කරනු ලබන දායකත්වයන් හා ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන වලට කරනු ලබන ගෙවීම් ඉවත් කළ පසු රජයේ මුළු වියදමත් අතර වෙනස ශුද්ධ මූල්‍ය හිඟය වේ. **(ලකුණු 02යි)**


(v) - බදු නොවන අයභාර මූලාශ්‍ර:

- ⋆ රාජ්‍ය ව්‍යවසායන්ගේ ලාභ හා ලාභාංශ
- ⋆ බදු කුලී
- ⋆ පොළී
- ⋆ ජාතික ලොතරැයි අරමුදල්
- ⋆ මහ බැංකුවේ ලාභ පවරා ගැනීම්
- ⋆ ගෙවීම් හා පරිපාලන ගාස්තු
- ⋆ සමාජ ආරක්ෂණ දායක මුදල්
- ⋆ ප්‍රාග්ධන භාණ්ඩ අලෙවි කිරීම්

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

www.SamithAlwis.wordpress.com

07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :





07 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 48%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 38%ක් පමණ ද

ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද

ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද

ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 9%ක් පමණ ද

ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 7ක් ඇති අතර අනු කොටස් 04ක පහසුතාව 45%ට වඩා වැඩිය. පහසුම අනු කොටස i (අ) වී ඇති අතර, එහි පහසුතාව 76%කි. පහසුතාව අඩුම අනුකොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 26%කි.

www.SamithAlwis.wordpress.com

★ i අනු කොටස ගෝලීය පොදු භාණ්ඩ, පොදු සම්පත් සහ අර්ධ පොදු භාණ්ඩ යන සංකල්ප උදාහරණ සහිතව අර්ථ දැක්වීමේ හැකියාව පරීක්ෂාවට යොමු වූ උප කොටස් 3කින් යුත් ගැටලුවකි.

'අ' උප කොටසේ පහසුතාව 76%කි. ගෝලීය පොදු භාණ්ඩ, පොදු භාණ්ඩ යන සංකල්පය තුළම ඇතුළත් සුවිශේෂ තත්ත්වයක් බවත් එහි ප්‍රතිලාභ සමස්ත ගෝලීය ප්‍රජාවට හිමිවන බවත් හා ඊට අදාළ උදාහරණ නිවැරදි ව ඉදිරිපත් කිරීමේ හැකියාවත් ප්‍රගුණ කළ යුතු බවත් ය.

'ආ' පහසුතාව 60%කි. පොදු සම්පත් සහ පොදු භාණ්ඩ යන සංකල්ප අතර වෙනස නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි වීම නිසා උදාහරණ දැක්වීමේදී ද අවබෝධය අසතුටුදායක බව පැහැදිලි විය.

'ඇ' පහසුතාව 58%කි. ධාරිතා මට්ටමට ළඟාවනතෙක් පාරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති බව පිළිතුරු වලින් නිවැරදිව හෙළිදරව් නොවූ බැවින් සහ නිවැරදි උදාහරණ දැක්වීමට අපොහොසත් වීම සාපේක්ෂව ඉහළ දුෂ්කරතාවයට හේතු විය.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන ගෝලීය පොදු භාණ්ඩ, පොදු සම්පත් සහ අර්ධ පොදු භාණ්ඩ වලට අදාළ ලක්ෂණ සහ උදාහරණ සුවිශේෂිව වෙන්කොට දැක්වීමට හැකිවන පරිදි දැනුම සංවර්ධනය කළ යුතුය.

* ii අනු කොටසේ පහසුතාව 27% ක් වැනි අඩු මට්ටමක් ගනී. ව්‍යවස්ථාපිත බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය නිශ්චිතව අර්ථ දැක්වීමට අපොහොසත් වීම ඊට හේතුවයි. ආර්ථික බදු ආපාතය පෞද්ගලික මූර්ත ආදායම වෙනස්වීම හෙවත් සැබෑ බදුබර පෙන්නුම් කරන බවත් ව්‍යවස්ථාපිත බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය අතර වෙනස බදු බර විතැන් කිරීමේ හැකියාව මත රදා පවතින බවත් වෙන්කොට දැක්වීමට නොහැකි විය. දුෂ්කරතාව නිසා බදු බර විග්‍රහ කිරීමට අදාළ සංකල්ප අවධාරණය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

* iii අනු කොටස සඳහා පහසුතාව 26%කි. බද්දක මධ්‍යස්ථභාවය සහ සාධාරණ බව යන ගුණාංග නිශ්චිතව හඳුනා නොගත් බව පිළිතුරුවලින් හෙළිදරව් විය. මධ්‍යස්ථ බද්දක් ආර්ථික තීරණ විකෘති වීම කෙරේ බලපෑමක් ඇති නොකරන බව අවධාරණය වන ආකාරයට දැනුම සංවර්ධනය විය යුතුය.

* iv අනු කොටසේ පහසුතාව 33% කි. රාජ්‍ය අයවැය ආශ්‍රිත සංකල්ප විමසීමට යොමු වූ ගැටලුවකි. ප්‍රාථමික හිගය සහ ශුද්ධ මූල්‍ය හිගය ගණනය කිරීමට ඇතුළත් කළ යුතු දැ මොනවාද ? යන්න නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. එබැවින් අදාළ සංකල්ප පිළිබඳ දැනුම හා සංඛ්‍යාත්මක ගණනය කිරීම මගින් එය ඉදිරිපත් කිරීමේ කුසලතාව සංවර්ධනය කළ යුතුය.

* රාජ්‍ය අයභාරයේ බදු නොවන මූලාශ්‍ර පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැතිවීම නිසා පහසුතා දර්ශකය 48% ක් වැනි මට්ටමක පවතී. අදාල මූලාශ්‍ර ගවේෂණයට යොමු කිරීමෙන් සාධන මට්ටම ඉහළ නංවා ගත හැක. (උදා: මහ බැංකු වාර්තාව)

## 08 ප්‍රශ්නය

8. (i) **සාපේක්ෂ වාසි හට ගන්නා මූලාශ්‍ර කවරේ ද?** *(ලකුණු 04 යි)*
   (ii) **ගෙවුම් ශේෂ ලේඛනයක ඇතුළත් වන ප්‍රධාන ගිණුම් සහ අයිතමයන් කවරේ ද?** *(ලකුණු 04 යි)*
   (iii) **රටක වෙළෙඳ අනුපාතය සහ වෙළෙඳ ශේෂය අතර වෙනස දක්වන්න.** *(ලකුණු 04 යි)*
   (iv) **ජාත්‍යන්තර වෙළෙඳම් ක්ෂේත්‍රය තුළ ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) කාර්යභාරය කවරක් වේ ද?** *(ලකුණු 04 යි)*
   (v) **පාලිත නම්‍ය (managed float) විනිමය අනුපාතික ක්‍රමයක් යන්නෙන් අදහස් වන්නේ කුමක් දැයි විස්තර කරන්න.** *(ලකුණු 04 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(8) (i) - සාධක සම්භාරයේ වෙනස්කම්
- අභිරුචියේ වෙනස්කම්
- පරිමාණානුකූල පිරිමැසුම්
- තාක්ෂණික දියුණුව සහ නව්‍යතා
- ස්ථානගත වීම
- විශේෂ ප්‍රාගුණ්‍යනය
- භාණ්ඩ ප්‍රභේදනය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- ආරම්භක තත්ත්වය

**(එක් මූලාශ්‍රයකට ලකුණු 01ක බැගින් ඕනෑම මූලාශ්‍ර 04කට ලකුණු 04යි)**

www.SamithAlwis.wordpress.com

(ii) - වර්තන ගිණුම්
- භාණ්ඩ
- සේවා
- ආදායම්
- සංක්‍රාම

- ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම
  - ප්‍රාග්ධන ගිණුම
    - ප්‍රාග්ධන සංක්‍රාම
    - නිෂ්පාදනය නොකළ සහ මූල්‍ය නොවන වත්කම් අත්කර ගැනීම
  - මූල්‍ය ගිණුම
    - සෘජු ආයෝජන
    - කළඹ ආයෝජන
    - වෙනත් ආයෝජන (ණය)
    - සංචිත වත්කම්

**(වර්තන ගිණුමේ ප්‍රධාන අයිතම 04ට ලකුණු 02යි; ප්‍රාග්ධන ගිණුමේ අයිතමයනට ලකුණු 01යි; මූල්‍ය ගිණුමේ අයිතමයනට ලකුණු 01යි. මුළු ලකුණු 04යි)**

(iii) - වෙළෙඳ අනුපාතයෙන් පෙන්නුම් කරනුයේ ආනයන ඒකකයක් ලබා ගැනීම සඳහා අපනයනය කළ යුතු භාණ්ඩ ඒකක ප්‍රමාණයයි. (ලකුණු 01යි)

- වෙළෙඳ අනුපාතය ගණනය කරනුයේ අපනයන මිල දර්ශකය ආනයන මිල දර්ශකයෙන් බෙදීමෙනි. $\frac{Px}{Pm} \times 100$ (ලකුණු 01යි)

- වෙළෙඳ ශේෂය යනු භාණ්ඩ අපනයන හා භාණ්ඩ ආනයන වටිනාකම අතර පවතින වෙනස වේ. (X - M) (ලකුණු 01යි)

- වෙළෙඳ අනුපාතය අපනයන හා ආනයනවල සාපේක්ෂ මිල මත රඳා පවතින අතර, වෙළෙඳ ශේෂය අපනයන හා ආනයනවල වටිනාකම මත රඳා පවතී. (ලකුණු 01යි)

(iv) **ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්යය භාරය:**

- වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම (trade negotiations)

- ගිවිසුම් ක්‍රියාවට නැංවීම හා ඒවා අධීක්ෂණය කිරීම (implementation and monitoring) සාමාජික රටවල් එකඟ වී ඇති ආකාරයට තම වෙළෙඳ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවනවා ද ඒවායේ පාරදෘශ්‍ය භාවයක් පවතිනවා ද යනාදිය අධීක්ෂණය කෙරේ.

- වෙළෙඳ ආරවුල් බේරුම් කිරීම (dispute settlement) ගිවිසුම් ප්‍රකාරව සාමාජික රටවලට ඇති අයිතිවාසිකම් කිසියම් රටක් විසින් උල්ලංඝනය කරනු ලැබ ඇත්නම් ඒ පිළිබඳ ආරවුල් බේරුම් කිරීමේ කාර්යය.

- සාමාජික රටවල වෙළෙඳ ධාරිතාව ගොඩ නැංවීම (building trade capacity) ලෝක වෙළෙඳ සංවිධාන ගිවිසුම යටතේ සංවර්ධනය වෙමින් පවත්නා රටවලට විශේෂ පහසුකම් සලසා ඇත. ගිවිසුම් ක්‍රියාවට නැංවීම සඳහා සාපේක්ෂව දීර්ඝ කාලයක් ලබා දීම. වෙළෙඳ අවස්ථා වැඩි කර ගැනීමට හා වෙළෙඳ ධාරිතාව පුළුල් කර ගැනීමට විශේෂ පහසුකම් සැපයේ.

- ප්‍රජාව දැනුවත් කිරීම (outreach) ලෝක වෙළෙඳෙ සංවිධානයේ විවධ ක්‍රියාකාරකම් පිළිබඳව රාජ්‍ය නොවන සංවිධාන, පාර්ලිමේන්තුවල සිටින දේශපාලඥයන්, ජනමාධ්‍යකරුවන් හා සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා නිරන්තර වැඩ සටහන් ක්‍රියාත්මක කරයි.

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

www.SamithAlwis.wordpress.com

(v) - පාලිත නම්‍ය විනිමය අනුපාතිකය වූ කලී ස්ථාවර විනිමය අනුපාතිකය හා නම්‍ය විනිමය අනුපාතිකය යන ක්‍රම දෙකෙහි දක්නට ඇති යහපත් ලක්ෂණවලින් වාසි ලබා ගැනීම සඳහා සකසා ගනු ලැබූ එම ක්‍රම දෙකෙහිම සංකලනයකි.

- මෙහි දී මූල්‍ය අධිකාරීන් විසින් දේශීය මුදල් ඒකකය සඳහා ස්ථාවර විනිමය අනුපාතිකයක් තීරණය කොට, එය එක්තරා පරාසයක් තුළ දෝලනය වීමට ඉඩ හරිනු ලැබේ.

- පරාසය ඉක්මවා විනිමය අනුපතිකය වෙනස්වීමට නැඹුරු වන විට, විනිමය අනුපාතිකයේ ක්ෂය වීම් හා අගය ඉහළ යාම් වැළැක්වීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළ තුළ දේශීය මුදල් විකිණීමේ හා මිලදී ගැනීමේ යෙදෙමින් විනිමය අනුපාතිකයේ දෝලනයන් පාලනය කෙරේ.


- මෙම ක්‍රමය යටතේ වෙළෙඳපොළ බලවේග තුළින් විනිමය අනුපාතිකය නිදහසේ තීරණය වීමට ඉඩ නොහැර, විනිමය අනුපාතිකයේ දෝලනයන් පාලනය කිරීමට මහ බැංකු විදේශීය විනිමය වෙළෙඳපොළට මැදිහත් වීම් කරන බැවින්, එය පිරිසිදු පාවීමක් (clean float) නොව, අපිරිසිදු පාවීමක් (dirty float) ලෙස ද හැඳින්වේ.

- පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය යටතේ කෙටි කාලයේදී විනිමය අනුපාතිකයේ උච්ඡාවචන පාලනය කිරීමට විනිමය වෙළෙඳපොළට මැදිහත් වීම් කරන අතර, දිගු කාලයේදී වෙළෙඳපොළ බලවේග විසින් විනිමය අනුපාතිකය තීරණය වීමට ඉඩ හැරේ.


**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

www.SamithAlwis.wordpress.com

08 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




08 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 34%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 34%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 9%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 5ක් ඇති අතර අනු කොටස් 04ක පහසුතාව 40%ට වඩා වැඩිය. (ii) අනු කොටස පහසුම ප්‍රශ්නය වී ඇති අතර, එහි පහසුතාව 66%කි. පහසුතාව අඩුම අනුකොටස (v) වී ඇති අතර, එහි පහසුතාව 32%කි.

- ⋆ i කොටස පහසුතාව 56% කි. සාපේක්ෂ වාසි බිහිවීම කෙරේ බලපාන සාධක පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවේ.

- ⋆ ii අනු කොටසේ පහසුතාව 66%කි. ගෙවුම් ශේෂ ලේඛනයේ ප්‍රධාන ගිණුම් සහ එක් එක් ප්‍රධාන ගිණුමට අයත් උප ගිණුම් පිළිබඳව අවබෝධය මැනීමට යොමු වූ ගැටලුවකි. වර්තන ගිණුමේ සංයුතිය නිවැරදිව දැක්වීමට සිසුන් සමත් වුවත් දෙවන ප්‍රධාන ගිණුම වන ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමට ඇතුළත් අයිතමයන් පිළිබඳ දැනුම නිශ්චිත නොවුනි. එබැවින් ගෙවුම් ශේෂ ලේඛනයේ සංයුතිය දැක්වෙන සටහන් ප්‍රදර්ශනය කිරීම තුළින් සහ විවිධ ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීමේ හැකියාව වර්ධනය කිරීම තුළින් දුෂ්කරතාව අඩුකර ගත හැක.

- ⋆ iii අනු කොටස සඳහා පහසුතාව 49%කි. වෙළෙඳ අනුපාතය සහ වෙළෙඳ ශේෂය නිවැරදිව අර්ථ දැක්වීම සහ අගයන් ගණනය කරන ආකාරය දැක්වීම දුර්වල විය. ඊට අමතරව එම සංකල්ප දෙක අතර වෙනසට බලපාන සාධක දැක්වීමට නොහැකිවීම විශේෂ දුර්වලතාවයකි. එබැවින් ගෙවුම් ශේෂය හා විදේශ වෙළෙඳාම ආශ්‍රිත සංකල්ප ගවේශණයට හා සංඛ්‍යාත්මක ගණන කිරීම සඳහා යොමු කරවිය යුතුය.

- ⋆ iv අනු කොටසේ පහසුතාව 42%කි. ලෝක වෙළෙඳ සංවිධානය පිළිබඳව දැනුම පරීක්ෂා කළ ප්‍රශ්නයකි. බොහෝ සිසුන් කරුණු ඉදිරිපත් කිරීමේදී එහි කාර්යභාරය පිළිබඳ ඔවුන්ගේ ආකල්ප මත පිළිතුරු ලිවීමට යාමෙන් ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්යභාරය පිළිබඳ දැනුම ඉතා අඩු මට්ටමක පවතී. එබැවින් ජාත්‍යන්තර සංවිධානවල කාර්යභාරය හා අරමුණු පිළිබඳ නිශ්චිත දැනුම සංවර්ධනය කිරීමට ක්‍රියා කළ යුතුය.

- ⋆ v අනු කොටස 32%ක් වැනි අඩුම පහසුතාවක් දැක්වූ ප්‍රශ්නයකි. පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය පිළිබඳ දැනුම පරීක්ෂාවට යොමු වූ ප්‍රශ්නයකි. මෙවැනි ක්‍රමයක් භාවිතා කිරීමට හේතු, විනිමය අනුපාතය තීරණය වන ආකාරය, එහි වෙනස් වීම් මත මූල්‍ය අධිකාරිය මැදිහත් වන ආකාරය සහ ඒ හා බැඳුණු අනෙකුත් කරුණු ක්‍රමවත්ව ඉදිරිපත් කිරීමේ පූර්ණ අවබෝධයක් ලබා දීමට හැකි වන ආකාරයට ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය විය යුතුය.

www.SamithAlwis.wordpress.com

## 09 ප්‍රශ්නය

9. (i) 'ආර්ථික වෘද්ධි අනුපාතිකය' සහ 'ආර්ථික වෘද්ධිය' යන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*
 (ii) ආර්ථික වෘද්ධියට දායක වන ප්‍රධාන මූලාශ්‍ර කවරේ ද? *(ලකුණු 04 යි)*
 (iii) සංවර්ධනය පිළිබඳ දර්ශකයක් වශයෙන් මානව සංවර්ධන දර්ශකයේ අඩුපාඩු කවරේ ද? *(ලකුණු 04 යි)*
 (iv) ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව පිළිබඳ මෑත කාලීන උපනති පරීක්ෂා කරන්න. *(ලකුණු 04 යි)*
 (v) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථික විෂමතා අඩු කිරීම සඳහා රජය විසින් මෑත දී ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(09) (i) - කිසියම් කාල පරිච්ඡේද දෙකක් අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි හෝ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයෙහි හෝ වෙනස ප්‍රතිශතාත්මකව දැක්වීම ආර්ථික වෘද්ධි අනුපාතිකය වේ.

**(ලකුණු 01යි)**

- කාලයත් සමඟ ආර්ථිකයේ විභව නිමැවුම හෝ නිෂ්පාදන ධාරිතාව හෝ ප්‍රසාරණය වීම ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් වේ. එය ඉල්ලුම, සැපයුම සහ කාර්යක්ෂමතාව යන සාධකයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය තුළින් හට ගන්නා ගතික ක්‍රියාවලියකි.

**(ලකුණු 02යි)**

- ආර්ථික වෘද්ධි අනුපාතිකයෙන් මැනෙනුයේ නිමැවුමේ හටගත් සැබෑ වෙනස්වීම වන නමුදු, ආර්ථික වෘද්ධියෙන් මැනෙනුයේ ආර්ථිකයේ විභව නිෂ්පාදන ධාරිතාවේ ප්‍රසාරණයයි.

**(ලකුණු 01යි)**

(ii) - සම්පත් සම්භාරය ඉහළ යාම.
 - භෞතික ප්‍රාග්ධනය වැඩිවීම
 - මානව ප්‍රාග්ධනය වැඩිවීම
 - ස්වභාවික ප්‍රාග්ධනය වැඩිවීම
 - සමාජ ප්‍රාග්ධනය වැඩිවීම

- ඵලදායිතාවය ඉහළ යාම
 - තාක්ෂණික දියුණුව
 - නව්‍යතාවන් බිහිවීම
 - පර්යේෂණ හා සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජනය වැඩිවීම
 - කළමනාකරණය දියුණු වීම

- ආර්ථික ස්ථායිතාවය

- සානුබල (ප්‍රෝත්සාහන) පැවැතීම

- ව්‍යවසායකත්වයේ වර්ධනය

- යහපාලනය

- දේශපාලන හා සමාජ ස්ථාවරත්වය

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

www.SamithAlwis.wordpress.com

(iii) - මානව සංවර්ධන දර්ශකය සමාහාර (aggregate) මිනුමක් වන බැවින්, රටවල් අභ්‍යන්තරයේ දැකිය හැකි විෂමතාවන් (ආදායම් විෂමතාවන්, ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන්) හඳුනාගත හැකි නොවේ.

- මානව සංවර්ධනයේ සියලු පැතිකඩ මේ යටතේ ආවරණය නොවේ.
  උදාහරණ: ජන සහභාගිත්වය, දේශපාලන නිදහස, මානව සුරක්ෂිතතාව (human security)

- දර්ශකය තුළ ඇති ප්‍රධාන සංරචකයනට සමාන බර තැබීමක් ලබා දී ඇත.

- ගුණාත්මක වෙනස්කම් සැලකිල්ලට නොගැනේ.
  උදාහරණ: පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය, සෞඛ්‍ය පහසුකම් වල ගුණාත්මක වෙනස්කම් යනාදිය.

- අධ්‍යාපනය මිනුම් කිරීමේදී ප්‍රාථමික අධ්‍යාපනයට ආරම්භයේදී යොමු වූ ශිෂ්‍ය සංඛ්‍යාව පමණක් සැලකිල්ලට ගනී. එහෙත් අතරමගදී පාසල් හැර යන ප්‍රමාණය සැලකිල්ලට නොගැනේ.

- සංවර්ධනය කෙරෙහි බලපාන පාරිසරික පැතිකඩ මේ තුළ සැලකිල්ලට නොගැනේ.

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

(iv) - බහුමාන දරිද්‍රතාවේ උපනති:
- 5.3% (2003 - UNDP)
- 7.0% (2006/07 - IPS)
- 4.7% (2009/10 - IPS)

**(එක් වර්ෂයක නිවැරදි දත්ත සඳහා ලකුණු 02ක බැගින් මුළු ලකුණු 04යි)**

**[විකල්ප පිළිතුර:**

බහුමාන දරිද්‍රතාවට දායක වන ඇතැම් සාධකයන්ගේ කාලීන උපනති:

| | 2003 | 2009/10 |
|---|---|---|
| - පෝෂ්‍යදායි ආහාර ප්‍රමාණවත්ව නොලැබීම | 33% | 25% |
| - විදුලිබලය නොලැබීම | 9% | 8% |
| - පානීය ජලය නොලැබීම | 8% | 3% |
| - වත්කම් ප්‍රමාණවත්ව නොතිබීම | 13% | 8% |

**(සන්සන්දනාත්මකව පෙන්නුම් කරන එක් විචල්‍යයකට ලකුණු 02 බැගින් ඕනෑම විචල්‍ය 02කට ලකුණු 04යි)]**

www.SamithAlwis.wordpress.com

(v) - ගම නැගුම

- මග නැගුම

- ප්‍රාදේශීය සංවර්ධනය කේන්ද්‍රකරගත් පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන විශේෂ වැඩසටහන් (උතුරු වසන්තය, නැගෙනහිර නවෝදය, රජරට නවෝදය, වයඹ පුබුදුව, පුබුදමු වෙල්ලස්ස, කඳුරට උදානය, සබරගමු අරුණාලෝකය, රන් අරුණ).

- නැණසල (විඥාපණ තාක්‍ෂණ මධ්‍යස්ථාන) වැඩසටහන්


- වැව් 10,000ක් පුනරුත්ථාපනය කිරීම / දහසක් මහ වැව් වැඩ සටහන

- දිවි නැගුම

- ග්‍රාමීය විදුලිබල සැපයුම් වැඩසටහන


**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

**09 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




09 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 33%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 52%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 14%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ට වඩා ලබාගත් පිරිස 16%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 74% ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ 10 ට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 5ක් ඇති අතර අනු කොටස් 02ක පහසුතාව 40%ට වඩා වැඩිය. පහසුම අනු කොටස (v) වී ඇති අතර, එහි පහසුතාව 47%කි. පහසුතාව අඩුම අනුකොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 6%කි.

- i අනු කොටසේ පහසුතාවය 39% කි. ආර්ථික වෘද්ධිය සහ ආර්ථික වෘද්ධි අනුපාතිකය යන සංකල්ප අතර වෙනස විමසා ඇති මෙම ගැටළුව 61% ක දුෂ්කරතාවයට හේතුවී ඇත්තේ ආර්ථික වෘද්ධිය නිවැරදිව නිර්වචනය නොකිරීම සහ එය මිනුම්කිරීමේ නිර්ණායකය ලෙස ආර්ථික වෘද්ධි අනුපාතිකය නිවැරදිව නිර්වචනය කිරීමට අපොහොසත්වීම නිසා ය. එබැවින් එම සංකල්ප නිරවුල්ව නිර්වචනය කිරීමේ දැනුම ලබාදිය යුතුය.

- ii අනු කොටසේ පහසුතාවය 42% කි. ආර්ථික වෘද්ධියට දායකවන ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ විමසා ඇති ගැටලුව දුෂ්කරතාවයට පාත්‍රවී ඇත්තේ ආර්ථික වෘද්ධියේ ප්‍රධාන මූලාශ්‍ර හා ඒවා තුළ ඇතුළත් උප සාධක ඉදිරිපත් කිරීමට සිසුන් අපොහොසත් වීම නිසාය. එම දැනුම සිසුන්හට ලැබෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

- iii අනු කොටසේ පහසුතාවය 24% ක් වැනි අඩුමට්ටමක පවතී. මානව සංවර්ධන දර්ශකයේ දුබලතා පිළිබඳ විමසන මෙම ප්‍රශ්නයේ ඉහළ දුෂ්කරතාවයට හේතුවී ඇත්තේ මානව සංවර්ධන දර්ශකයේ අඩුපාඩු කවරේද යන්න පිළිබඳ සිසුන් මනා දැනුමකින් පෝෂණය වී නොමැතිකමය. සංවර්ධනය පිළිබඳ සංයුක්ත දර්ශකයන් වන මානව සංවර්ධන දර්ශකය, භෞතික ජීවන තත්ව දර්ශකය වැනි දර්ශකයන්ගේ දුබලතා සහ ප්‍රබලතා පිළිබඳව සිසුන් දැනුවත් විය යුතුය.

- iv 94% ක් වැනි ඉහළම දුෂ්කරතාවයක් පෙන්වන මෙම අනු කොටස මගින් ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව පිළිබඳ මෑ කාලීන උපනතීන් පරීක්ෂාකරයි. මානව සංවර්ධන වාර්තාව මගින් ලබාගත් ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව පිළිබඳ තොරතුරුද ඒ අනුව ශ්‍රී ලංකාව හිමිකර ගත් ස්ථානය ද පිළිබඳ දැනුම යාවත්කාලීන විය යුතුය.

- v අනු කොටසේ පහසුතාවය 47% කි. මෙම කොටස මගින් පරීක්ෂා ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථික විෂමතා අඩු කිරීමට රජය විසින් මෑතදී ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වැඩසටහන් පිළිබඳවය. මෙම ගැටලුව දුෂ්කර වීමට හේතුවී ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශික ආර්ථික විෂමතා අඩු කිරීමට රජය විසින් ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ග පිළිබඳ ප්‍රමාණවත් දැනුම සිසුන් තුළ නොමැති බැවිනි. එම ඌනතා ඉවත් කරනු පිණිස අදාළ තොරතුරු පිළිබඳ දැනුමින් පෝෂණය විය යුතුය.

www.SamithAlwis.wordpress.com

## 10 ප්‍රශ්නය

10. (i) ලෝකයේ ප්‍රධාන කාර්මික රටවල් මුහුණ පා සිටින මන්දගාමී ආර්ථික වෘද්ධිය හා ආර්ථික පසුබෑසීම් (ප්‍රතිගමනයන්), ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත කෙබඳු බලපෑමක් ඇති කෙරේ ද? *(ලකුණු 05 යි)*

(ii) 'ශ්‍රී ලංකාවේ රජය සතු ව්‍යාපාරික ව්‍යවසායන්ගේ (state owned business enterprises) කාර්ය සාධනය දිගින් දිගටම අයහපත් වෙමින් පවතී.' මෙම ව්‍යවසායන්ගේ දක්නට ලැබෙන ප්‍රධාන ඌනතා කවරේ ද යි සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

(iii) 1977-2004 කාලය තුළ ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති සමග සැසඳීමේ දී, ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධන ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ කවරේ ද? *(ලකුණු 05 යි)*

(iv) **'දිවි නැගුම'** වැඩසටහනෙහි ප්‍රධාන ලක්ෂණ සැකෙවින් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(10) (i) - ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝ කලාපය වෙත යොමුවන ශ්‍රී ලංකාවේ අපනයනවල වර්ධනය මන්දගාමී වීම.

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත හා සංචාරක අංශය යුරෝපා ආර්ථිකය මත දැඩි රඳා පැවැත්මක් පෙන්නුම් කරන බැවින්, ශ්‍රී ලංකාව මත දැඩි පීඩනයක් ඇති වේ. (ඇඟලුම් අපනයන 50%ක් ද, ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් 42%ක් ද පැමිණෙනුයේ යුරෝපා සංගමයේ රටවලිනි.)

- විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ අඩු වීමට පිළිවන. ශ්‍රී ලංකාවේ මුළු ප්‍රේෂණ ලැබීම්වලින් 17%ක් ලැබෙනුයේ යුරෝ කලාපයෙනි.

- අපනයන ආදායම්වල මන්දගාමී වර්ධනය, ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂයට අයහපත් ලෙස බලපෑමට පිළිවන. දැනටමත් ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක පමණ වෙළෙඳ ශේෂ හිඟයක් පවතී. මේ නිසා රුපියලේ බාහිර අගය ක්ෂය වනු ඇත.

- ඇමෙරිකා එක්සත් ජනපදයේ හා යුරෝපයේ පවත්නා ආර්ථික පසුබෑසීම චීනය හා ඉන්දියාව ඇතුළු නැගී එන ආර්ථිකයන්ගේ ආර්ථික වර්ධනයට ද තර්ජනයක් වී ඇත. ඉන්දියාව හා චීනය, ශ්‍රී ලංකාවේ ද ප්‍රධාන වෙළෙඳ හා ආයෝජන පාර්ශවකරුවන් වන බැවින්, ශ්‍රී ලංකාවට එය අයහපත් තත්ත්වයක් වනු ඇත.

- ශ්‍රී ලංකාවේ විදේශ වත්කම්වල වර්ධනය ප්‍රමාණවත් නොවන විට, වාණිජ මූලාශ්‍ර වලින් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගැනීමට සිදුවීමෙන් විදේශ ණය බර ඉහළ යනු ඇත.

- ගෝලීය ආර්ථික පසුබෑසීම නිසා බණිජ තෙල් සඳහා ඉල්ලුම අඩු වීමෙන්, ලෝක බණිජ තෙල් මිල පහළ වැටීමේ ප්‍රවණතාවක් ඇත. මෙය ශ්‍රී ලංකාවට වාසිදායක තත්ත්වයකි.

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 05කට ලකුණු 05යි)**

(ii) රාජ්‍ය ව්‍යාපාරික ව්‍යවසායන්ගේ සාධන ඌනතා:

- ව්‍යවස්ථාපිත වගකීම් පැහැර හැරීම
  - සාමූහික / ව්‍යාපාරික සැලැස්මක් (Corporate / Business Plan) නොතිබීම.
  - වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකිරීම.
  - විගණන විමසුම්වලට පිළිතුරු නොසැපයීම.
  - රාජ්‍ය ව්‍යාපාර කමිටුවේ (COPE) නිර්දේශ කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම.

www.SanithAlwis.wordpress.com

- මිලදී ගැනීම් ක්‍රියාවලියේදී (procurement) අනුමත ක්‍රමවේදනයට පටහැනිව කටයුතු කිරීම.

- මූල්‍ය අවභාවිතයන් (financial misappropriations)

- ආපසු ලැබිය යුතු ණය සහ වෙනත් ලැබීම් අයකර ගැනීමට කටයුතු නොකිරීම.

- සභාපති සහ කළමනාකරණ මණ්ඩලයන්ගේ නොහැකියාව. (lack of capacity)

- සේව්‍ය - සේවක සබඳතා දුර්වල වීම.

- දේශපාලනීකරණය.

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 05කට ලකුණු 05යි)**

(iii) - 1977/2004 කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ නිර්බාධකරණ ආර්ථික ප්‍රතිපත්තිය මූලික වශයෙන් පදනම්ව තිබුණේ 'නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති රාමුව' මතය. වර්තමාන රජයේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති රාමුව ප්‍රතික්ෂේප කොට, දේශීය ප්‍රභවය සහ ස්වදේශිකත්වය සහිත ප්‍රතිපත්ති මොඩලයක් අනුගමනය කරන බව ප්‍රකාශ කොට තිබේ.

- 1977/2004 ආර්ථික ප්‍රතිපත්තිය අපනයන ඉහළ නැංවීම කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් ලබා දුන් අතර, වර්තමාන ආර්ථික ප්‍රතිප්තිය දේශීය කෘෂිකර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යන ක්ෂේත්‍ර කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් ලබා දී ඇත.

- 1977/2004 ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ආර්ථිකය පෞද්ගලික ආයෝජනය හා වෙළෙඳපොළ යන්ත්‍රණය කෙරෙහි දැඩි රඳාපැවැත්මක් දැක් වූ අතර, රජය ආර්ථිකය තුළ හකුලා ගැනීමක් පෙන්නුම් කළේය. වර්තමාන ආර්ථික ප්‍රතිපත්ති යටතේ ආර්ථිකය තුළ රජයේ ආධිපත්‍යය ඉතා පුළුල් ලෙස ව්‍යාප්ත කොට තිබේ.

- 1977/2004 ආර්ථික ප්‍රතිපත්තිය තුළ පෞද්ගලීකරණය, ප්‍රතිපත්තිමය වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් හිමිකර ගෙන සිටි අතර, වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය පෞද්ගලීකරණය ප්‍රතික්ෂේප කොට තිබේ. රාජ්‍ය දේපොළ විකිණීම වෙනුවට බදු දීම කරනු ලැබේ.

- 1977/2004 කාලයේදී සමස්ත ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීමේ අරමුණට ප්‍රමුඛතාවක් ලබා දුන් අතර, එහි ව්‍යාප්ති ප්‍රතිවිපාක කෙරෙහි වැඩි සැලකිල්ලක් නොදැක්විණි. වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රාදේශීය සංවර්ධන විෂමතා ඉවත් කිරීමට යොමුවුණු වෘද්ධි උපාය මාර්ග කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට ඇත.

- 1977/2004 කාලයේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ රජයේ සුභසාධන වියදම් දැඩි සීමා කිරීමකට නතු කරනු ලැබුවද, වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය තුළ සුභසාධන වියදම් කප්පාදු කොට නොමැත. උදාහරණ වශයෙන් පොහොර සහනාධාරය ආපසු ලබා දීම.

- 1977/2004 ආර්ථික ප්‍රතිපත්තිය බාහිරාභිමුඛ සංවර්ධන උපාය මාර්ග කෙරෙහි දැඩි විශ්වාසයක් තබා තිබුණු අතර, වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය ආනයන ආදේශනය කෙරෙහි විශාල බරක් තබා ඇත.

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 05කට ලකුණු 05යි)**

www.SamithAlwis.wordpress.com

(v) දිවි නැගුම

- කුටුම්බවලට තමන්ගේ එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය කරන එළවළු සහ පළතුරු තම ගෙවත්තේදී ම නිපදවා ගැනීමටත්, දෛනික ආහාර අවශ්‍යතා සඳහා වෙළෙඳපොළ මත රඳාපැවැත්ම අඩු කිරීමත්, කුටුම්බයේ මූල්‍යමය සුරක්ෂිතතාවය ඉහළ නැංවීමත්, අරමුණු කරගෙන, 2012 අයවැය ලේඛනයත් සමඟ දිවි නැගුම වැඩ සටහන හඳුන්වා දෙන ලදී.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු කිහිපයකි.
  - කුටුම්බයේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.
  - කුටුම්බයේ ජීවන වියදම පහළ හෙළීම.
  - එළවළු සහ පළතුරු නිෂ්පාදනය 25% කින් වැඩි කිරීම.
  - ප්‍රතිශීර්ෂ එළවළු පරිභෝජනය දිනකට 134g සිට 175g දක්වා වැඩි කිරීම.
  - අතිරික්ත නිෂ්පාදනය අලෙවි කිරීමෙන් අතිරේක ආදායමක් උපයා ගැනීම.
  - ග්‍රාමීය ව්‍යවසායකත්වය දිරිමත් කිරීම.

- 2011 මාර්තු මාසයේ දී ආරම්භ කරන ලද ප්‍රථම වටය යටතේ පවුල් මිලියනයක් සවිබල ගැන්වීමට සැලසුම් කරන ලදී. ග්‍රාම නිලධාරී වසමකට පවුල් 100 බැගින් තෝරා ගනු ලැබිණි.

- ගෙවතු සැකසීම, එළවළු හා පලතුරු වගාව, පරිසර හිතකාමී වාතාවරණයක් ගොඩ නැගීම, ගෘහස්ථ කර්මාන්ත ඇරඹීම මේ යටතේ අපේක්ෂා කෙරේ.

- රජය විසින් පොහොර හා බීජ සැපයීම, පොල් පැළ, පළතුරු පැළ සහ ඖෂධ පැළ බෙදා දීම, කුකුල් පැටවුන් ලබා දීම මේ යටතේ සිදු කෙරේ.


- 2011 ඔක්තෝබර් මාසයේ ආරම්භකරන ලද දෙවන වටය යටතේ ගෘහ කර්මාන්ත, ස්වයං රැකියා, ධීවර හා සත්ව පාලනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට ඇත.

- මේවන විට නිවාස මිලියන 2.5ක් දිවි නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කොට ඇත. කිලිනොච්චිය හැර සෑම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක කෙරේ.

**(එක් කරුණකට ලකුණු 01ක බැගින් ඕනෑම කරුණු 05කට ලකුණු 05යි)**

www.SamithAlwis.wordpress.com


10 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




10 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 26%ක් පමණ වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 73%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 4%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ට වඩා ලබාගත් පිරිස 5%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 95% ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 4ක් ඇති අතර අනු කොටස් හතරේම පහසුතාව 27%ට වඩා අඩු වී ඇත. එයින් පහසුතාව වැඩිම අනුකොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 27%කි. පහසුතාව අඩුම අනු කොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 12%කි.

- ★ i අනුකොටසේ පහසුතාවය 23% කි. ශ්‍රී ලංකාවේ හා ලෝක ආර්ථිකයේ කාලීනව සිදුවන වෙනස්වීම් පිළිබඳව දැනුවත් භාවය නොමැති වීම 77% ක පමණ දුෂ්කරතාවට හේතුව ලෙස හඳුනාගත හැකිය. කාලීනව ලෝක ආර්ථිකයේ සිදුවන වෙනස්කම් හා එමගින් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති කරන බලපෑම පිළිබඳව තොරතුරු රැස්කර ගැනීමට ශිෂ්‍යයා උනන්දු විය යුතුය.


- ★ ii අනු කොටස පහසුතාව 27% කි. රාජ්‍ය ව්‍යාපාරික ව්‍යවසායන්ගේ අයහපත් කාර්ය සාධනයට නිශ්චිත හේතු දැක්වීමට ශිෂ්‍යයා අපොහොසත් වී ඇත. මෙය ද ප්‍රායෝගික දැනුම ප්‍රමාණවත් නොවීම නිසා මුහුණ දී ඇති ගැටලුවකි. අතිරේක කියවීම් හා තොරතුරු රැස්කර ගැනීමෙන් මෙම දුෂ්කරතාව මග හරවා ගත හැකි වනු ඇත.

- ★ iii අනු කොටසෙහි පහසුතාව 12% කි. 1977 න් පසු ශ්‍රී ලංකා ආර්ථික ප්‍රතිපත්ති වෙනස්වීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම, වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් වීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීමත්, වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීමත් මෙම ඉහළ දුෂ්කරතාවන්ට හේතුව ලෙස හඳුනාගත හැකිය.මෙම දුෂ්කරතාව විසඳා ගැනීමට අතිරේක කියැවීම් තුළින් තොරතුරු රැස් කිරීම ප්‍රයෝජනවත් වනු ඇත.

- ★ iv අනු කොටස 26% ක් තරම් අඩු පහසුතාවක් පෙන්වයි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීමේ උපාය මාර්ගය ලෙස කාලීනව හඳුන්වා දෙන ප්‍රතිපත්ති පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම මෙම ඉහළ දුෂ්කරතාවයට හේතුවයි. මෙවැනි කාලීන ආර්ථික වැඩසටහන් ගවේශනයට ශිෂ්‍යයා යොමු කළ යුතුය.

www.SanithAlwis.wordpress.com

**2.2.3** II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




ඉහත ප්‍රස්තාරය දෙස බැලීමේ දී සමස්ත වශයෙන් II ප්‍රශ්න පත්‍රයේ පහසුතාව අඩුම ප්‍රශ්නය වශයෙන් 10 වන ප්‍රශ්නය දැක්විය හැකි අතර, එහි පහසුතාව 22% පමණ වේ.

එමෙන්ම පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ ප්‍රශ්න අංක 02 වන අතර, එහි පහසුතාව 60% පමණ වේ.

එමෙන්ම ප්‍රශ්න අංක 4, 7, 8 සහ 10 හැර අනෙකුත් සියළුම ප්‍රශ්නවල පහසුතාව 50% ට වඩා වැඩි වී ඇත. සමස්ත ප්‍රශ්න පත්‍රය සැළකීමේ දී II ප්‍රශ්න පත්‍රයේ සමස්ත පහසුතාව 47% ක් ලෙස දැක්විය හැක.

www.SamithAlwis.wordpress.com

## III කොටස

### 3.0 පිළිතුරු සැපයීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

### 3.1. පිළිතුරු සැපයීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස්**

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතු ය. තව ද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් උත්තර පත්‍රයේ යෙදිය යුතුය.
- ★ II පත්‍රයේ (අ) හා (ආ) කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ★ ප්‍රශ්න අංක හා අනු අංක නිවැරදිව ලිවිය යුතුය.
- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.
- ★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
- ★ පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.
- ★ ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාල කළමනාකරණය කරගත යුතුය.

www.SanithAlwis.wordpress.com

**විශේෂ උපදෙස් :**

* ආර්ථික විද්‍යා විෂයයේ භාවිත වන පාරිභාෂික යෙදුම් භාවිත කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී සංඛ්‍යාත්මක වගු, ප්‍රස්තාර, සමීකරණ මගින් පිළිතුරු පැහැදිලි කළ යුතුය. ප්‍රස්තාර සටහන් ඇඳීමේදී නිවැරදි පරිමාණයකට ඇඳීමටත්, අක්ෂ නිවැරදිව නම් කිරීමටත් සැලකිලිමත් විය යුතුය..

* ගණනය කිරීම්වලදී එක් එක් පියවර පැහැදිලිව සඳහන් කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී නිවැරදි සංකේත භාවිත කළ යුතුය.

* අදාල රූප සටහන් අඳින විට රේඛා නිවැරදිව නම් කිරීම හා ප්‍රවාහයන්ගේ දිශාව නිවැරදිව දැක්වීම කළ යුතුය.

**3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :**

* සංකල්ප පිළිබඳ නිවැරදි හා නිශ්චිත දැනුම තිබිය යුතු අතර, සංකල්ප පිළිබඳ ප්‍රායෝගික භාවිතයන්ද ප්‍රගුණ කළ යුතුය.

* ආර්ථික හා සමාජයීය කරුනු පිළිබඳව කාලීනව හටගන්නා වෙනස්වීම් පිළිබඳ සතුටුදායක අවබෝධයක් ලබා ගත යුතුයි.

* මේ සඳහා ශ්‍රී ලංකාවේ මහා බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වැනි ආයතනවලින් නිකුත්කරන වාර්තා හා ප්‍රකාශන පරිශීලනය කිරීමට හුරුවිය යුතුයි.

www.SamithAlwis.wordpress.com

# A/L 2021 - Home Visiting

Colombo & Gampaha

The Ideal class for your eminent university dream

econ අපි

සමිත් අල්විස් Econ (Sp) - Kelaniya, HRM - OU

☎ 071-7556342




නිෂ්පාදන factor

www.SamithAlwis.wordpress.com

සරසවියට shortcut එකක්